# රණවිරුවා

2021 ජූලි • 231 කලාපය



ඉක්ම යා නොදී රෝ බිය අපල වින
නික්ම නොයම් මුදවාලන තුරුම දන
රැක්ම පිණිස සටනෙහි පෙර දුන්නු අණ
දැක්ම රකින්නයි මව්බිම ලෙසින් පණ

- මේජර් ප්‍රවීන් චමින්ද විදිසිංහ -

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



# යුද්ධ හමුදාවෙන් නවෝත්පාදනයක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පර්යේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන ශාඛාව විසින් නවෝත්පාදනය කරන ලද නවීන තාක්ෂණයෙන් යුතු ස්වයංක්‍රීය දෑත් විෂබීජහරණය කිරීමේ යන්ත්‍රයක් ඉකුත් ජූලි 06 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙත හඳුන්වා දෙන ලදී.

මෙම අවස්ථාව සඳහා නවෝත්පාදකයින් නියෝජනය කරමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා පර්යේෂණ, විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන ශාඛාවේ වැඩබලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සුදත් උදයසේන සහභාගී වූහ.



යුද්ධ හමුදා සාමාජිකයන් ඉතා අවම පිරිවැයක් දරා නිෂ්පාදනය කරන ලද මෙම දෑත් විෂබීජහරණ යන්ත්‍රය තුළ විෂබීජනාශක දියර ලීටර් 4 ක් රඳවා තැබීමේ හැකියාව ඇති අතර, ඉන් පුද්ගලයින් 600 දෙනෙකුට පමණ දෑත් විෂබීජහරණය කිරීමේ හැකියාව පවතී. මෙම යන්ත්‍රය වරක් ආරෝපණය කිරීමෙන් පසු පැය 48 ක් ස්වයංක්‍රීයව නොකඩවා ක්‍රියාත්මක වීමද විශේෂත්වයකි.

# පැරා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය ඔප්නැංවීම සඳහා අවබෝධතා ගිවිසුමක්...

ත්‍රිවිධ හමුදා සහ සිවිල් අංශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍ය ඉහළ නැංවීමේ අරමුණින් සහ පැරා ක්‍රීඩා ක්ෂේත්‍රය වර්ධනය කිරීම උදෙසා නව අවබෝධතා ගිවිසුමකට එළඹීමට ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රීඩා කවුන්සිලයේ ජාතික පැරාලිම්පික් කමිටුව ක්‍රියාකරන ලදී. තවද පැරාලිම්පික් සහ වෙනත් ක්‍රීඩා ඉසව්වන් ඉලක්ක කරගනිමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරඟාවලියන් සඳහා සහභාගී වන මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් කෙටි කාලයක් තුළ ඉහළ නැංවීමේ අරමුණින් ගරු ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමන් එම අමාත්‍යාංශය හරහා රුපියල් මිලියන 47 ක මුදලක්ද මෙම වැඩසටහන සඳහා වෙන් කර ඇත.





ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමන් සමගින් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ සභාපති, ජාතික ක්‍රීඩා කවුන්සිලයේ සාමාජික, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් අමල් එදිරිසිංහ මහතා සහ ජාතික පැරාලිම්පික් කමිටුවේ සභාපති ලුතිනන් කර්නල් එල්ආර්ටීඩී හේරත් (විශ්‍රාමික) ඉකුත් ජූලි 14 වන දින කොළඹ 07 පිහිටි ජාතික ක්‍රීඩා කවුන්සිල කාර්යාලයේදී මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.






# ගුවන් සංක්‍රමික සෙබළු 200 ක් විසිරයති...












53 වන සේනාංකය යටතේ නිකවැව ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද ගුවන් සංක්‍රමික පුහුණු පාසලේ පාඨමාලා අංක 23 යටතේ සාර්ථකව පුහුණුව අවසන් කළ නිලධාරීන් 4 දෙනෙකු සහ සෙසුනිලයින් 196 දෙනෙකුගේ විසිරයාම එම පුහුණු පාසල් පරිශ්‍රයේදී ඉකුත් ජූලි 28 වන දින පැවැත්විණ. 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙම විසිරයාමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

එහිදී, පාඨමාලාව සාර්ථකව හැදෑරූ නිලධාරීන් සහ සෙසුනිලයින්ට නිල ලාංඡන පැළඳවීම ප්‍රධාන ආරාධිත අමුත්තා ඇතුළු සෙසු ආරාධිතයින් අතින් සිදුකරනු ලැබූහ. යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් පාඨමාලාවේ දක්ෂතම සිසුන්ට හිමි කුසලාන සහ සහතික පත් පිරිනැමුණු අතර, මෙවර පාඨමාලාවේ සැම අතින්ම අතිශූර සිසුවාට හිමි කුසලානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ දෙවන ලුතිනන් එම්ඩීබීඑන් මදුසංක විසින් හිමිකරගත් අතර පාඨමාලාවේ දක්ෂතම වෙඩික්කරුට හිමි කුසලානය හිමිකරගැනීමට ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් මදුසංක ඒඑච්එස් සමත් විය. තවද මෙම පාඨමාලාවේ හොඳම ශාරීරික යෝග්‍යතාවය ‌හෙබි සිසුවා ලෙස කුසලානය හිමිකරගැනීමට ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් ජයන්ත පීජීඩබ්ලිව් සමත් විය.

මෙම විසිරයාමේ උත්සවයට සමගාමීව පුහුණු පාසල් පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත නව මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය සඳහා මුල්ගල තැබීමද ගුවන් සංක්‍රමික පුහුණු පාසල් පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ නගරබද සටන් පුහුණු ගම්මානය අධිකාරියට පත් කිරීමද යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් සිදුකෙරිණ.

53 වන සේනාංකයේ සහ ගුවන් සංක්‍රමික බලසේනාවේ භටපිරිස් එක්ව සිදුකළ පුහුණු නිදර්ශනය දැකබලා ගැනීම සඳහා ද යුද්ධ හමුදාධිපතිතුමන් එක්විය.

විසිරයාමේ පෙළපාලිය අවසානයේ, අභිනවයෙන් ඉදිකළ 'Zero Wind' මීටර් 200 සුළු අවි වෙඩිපිටිය අධිකාරියට පත් කිරීම සහ විවෘත කිරීම සඳහා එක්වූ යුද්ධ හමුදාධිපතිතුමන් ගුවන් සංක්‍රමික බලසේනාවේ දක්ෂ වෙඩික්කරුවන් විසින් එහිදී ඉදිරිපත් කළ වෙඩිතැබීමේ සංදර්ශනයක්ද දැකබලා ගත්තේය.

ගුවන් සංක්‍රමික බලසේනාවේ බලසේනාධිපති කර්නල් පීඑස්එස් සංජීව ආර්එස්පී පීඑස්සී සහ ගුවන් සංක්‍රමික පුහුණු පාසලේ සේනාවිධායක ලුතිනන් කර්නල් එම්ඒඩීආර් මංගල ඇතුළු නිලධාරීන් සහ සෙබළුන් පිරිසක් මෙම අවස්ථාවට එක්වූහ.



# යාන්ත්‍රික පාබල විරුවන් වෙනුවෙන්
# නිවාඩු නිකේතනයක්...

යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අයවළුන් සඳහා දියතලාවේ නවතමයෙන් ඉදිකළ *'Mech Breeze'* නිවාඩු නිකේතනය ඉකුත් ජූලි 17 වන දින විවෘත කෙරිණ. යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති සහ යුද්ධ හමුදා පුහුණු අණසක ආඥාපති මේජර් ජෙනරාල් එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ආරාධනයකට අනුව සපැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් එම නිවාඩු නිකේතනය සුබ මොහොතින් විවෘත කරන ලදි.





යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සාමාජිකයන් සඳහා දිගුකාලීන අවශ්‍යතාවයක්ව පැවති මෙම නිවාඩු නිකේතනය නවීන ගෘහ භාණ්ඩ හා පහසුකම් සහිත සුඛෝපභෝගී කාමර 6 කින් සමන්විත වේ. රෙජිමේන්තු අරමුදලින් සහ රෙජිමේන්තුවේ හටපිරිස්වල තාක්ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වයෙන් මෙහි සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.

මෙම උත්සව අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සේවා වනිතා ඒකකයේ සභාපතිනි නෙලුම් වඩුගේ මහත්මිය ඇතුළු එම සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්ද එම රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක්ද සහභාගී වූහ.









# කොරෝනා මැඩලීමට පරිත්‍යාගයක්...



කොවිඩ් - 19 වෛරසය ආසාදිතයින්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ හා අංගෝපාංග තොගයක් ඇමරිකාවේ පිහිටි ධර්ම විජය පදනම හා බෞද්ධ විහාරය මගින් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත ඉකුත් ජූලි 01 වන දින ප්‍රදානය කරන ලදී. මෙම පරිත්‍යාග භාරදීමේ අවස්ථාවට එම සංගමයේ ප්‍රධානී ඇමරිකාවේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය ආචාර්ය වල්පොල පියනන්ද නායක හිමිපාණන් එක්වූ සේක.

මෙම උපකරණ අතරට රුධිර ස්පන්දනය සහ හෘද ස්පන්දනය නිරීක්‍ෂණය කිරීම සඳහා යොදාගන්නා යන්ත්‍ර, ඔක්සිජන් සැපයුම් යන්ත්‍ර, ලීටර් 10 ඔක්සිජන් සාන්ද්‍රණ මනින යන්ත්‍ර සහ රුධිර ඔක්සිජන් පරීක්‍ෂණ යන්ත්‍ර ඇතුළත් වූ අතර එහි දළ වටිනාකම ඇමරිකන් ඩොලර් 20,000 ක් පමණ වේ.

# නව ඇරඹුමක මතක සටහන්...





සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ (විශ්‍රාමික) ඉකුත් ජූලි 15 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. මෙම සුහද හමුවේදී, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්‍ෂ ජෙනරාල් වෙත සිය සුබපැතුම් එක් කළ යුද්ධ හමුදාධිපති රටේ මහජනතාවගේ යහපත උදෙසා සිදුකරන එම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඇගයීමටද ලක්කළේය.

# අභිමන් සෙවණේ සුහද හමුවන්...



ජූලි මස 23 දින සිට අගෝස්තු මස 8 දින දක්වා ජපානයේ, ටෝකියෝ නුවර පැවැත්වෙන 32 වන ඔලිම්පික් තරගාවලිය - 2020 සඳහා විනිසුරුවරයෙකු ලෙස සහභාගී වන පළමු යුද්ධ හමුදා නිලධාරි සහ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉකුත් ජූලි 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ සභාපති, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.

මෙම සුහද හමුවට එක්වූ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ සභාපති සුරේෂ් සුබ්‍රමනියම් මහතා, වෙඩි තැබීමේ කණ්ඩායමේ සභාපති ප්‍රදීප් එදිරිසිංහ, ඔලිම්පික් තරගාවලිය නියෝජනය කරනු ලබන ටෙහානි එගොඩවෙල (එයාර් රයිෆල් ඉසව්ව) සහ නිලූක කරුණාරත්න (බැඩ්මින්ටන් ඉසව්ව) යන මහත්ම මහත්මීන් යුද්ධ හමුදාධිපති සමග අදහස් හුවමාරු කරගත්හ.


ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ ලුතිනන් කර්නල් ඩීඑම්ටීසී දිසානායක 32 වන ඔලිම්පික් තරගාවලිය - 2020 වෙඩි තැබීමේ ඉසව්වේ විනිසුරුවරයෙකු ලෙස සහභාගිවන අතර, එලෙස විනිසුරුවරයෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගි වන පළමු නිලධාරියා ද ඔහු වේ. ඔලිම්පික් තරගාවලියක වෙඩි තැබීමේ ඉසව්වේ විනිසුරුවරයෙකු ලෙස තත් නිලධාරී තෝරා ගැනීම යුද්ධ හමුදාවට මෙන්ම ශ්‍රී ලංකාවටද ඉමහත් ගෞරවයකි.

---




ශ්‍රී ලංකාවේ බංග්ලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ නව මහ කොමසාරිස් ගරු තරික් මොහොමඩ් අරිෆුල් ඉස්ලාම් (*HE Tareq Mohammed Ariful Islam*) ඉකුත් ජූලි 08 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය. මෙම සුහද හමුවේදී, ජාතීන් අතර පවතින මිත්‍රශීලී හා දීර්ඝකාලීන සබඳතා පිළිබඳ මෙන්ම ත්‍රිවිධ හමුදා පුහුණු වැඩසටහන් පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

# මාණ්ඩලික ප්‍රධානී යුද්ධ හමුදාධිපති හමුවේ..






යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ලෙස නව පත්වීම් ලද මේජර් ජෙනරාල් ඩබලිව්එල්පිඩබලිව් පෙරේරා ආර්ඩබලිව්පි ආර්එස්පි එන්ඩියූ ඉකුත් ජූලි 15 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබලිව්ඩබලිව්වී ආර්ඩබලිව්පි ආර්එස්පි වීඑස්වී යූඑස්පි එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවිය.

මෙම හමුවේදී මාණ්ඩලික ප්‍රධානී ගේ නව පත්වීම වෙනුවෙන් සුබපැතුම් පිරිනැමූ යුද්ධ හමුදාධිපතිතුමන් "2020-2025 ඉදිරි උපාය මාර්ග සැලැස්ම" සහ නිලධාරීන්ගේ පුහුණුවීම් තවදුරටත් ප්‍රවර්ධනය කරගැනීම යන කරුණු පිළිබඳ සහ යුද්ධ හමුදාවේ විධිවිධාන තවදුරටත් වැඩිදියුණු කළ හැකි ආකාරය පිළිබඳ අදහස් හුවමාරු කරගත්හ.

# විරු දිරි මෙහෙයට 37 වසරක්...

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයට ඉකුත් ජූලි 12 වන දිනට වසර 37 ක් සපිරුණි. ඒ වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහන් මාලාවක් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ උපදෙස් මත ඉකුත් ජූලි 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

2019 වසරේ අගෝස්තු මස 19 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ලෙස පත්වූ වත්මන් සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය සමගින් සේවා වනිතා ඒකකයේ උප සභාපතිනි ශ්‍යාමලි බණ්ඩාර මහත්මිය, සේවා වනිතා ඒකකයේ ලේකම් සුමාලි මාදොල මහත්මිය, සේවා වනිතා ඒකකයේ උප ලේකම් ශ්‍යාමිණි කොටුවේගොඩ මහත්මිය, මහජන සම්බන්ධතා නිලධාරිනී දීපා හඳුන්මුල්ල මහත්මිය, උප මහජන සම්බන්ධතා නිලධාරිනී නෙලුම් වඩුගේ මහත්මිය සහ ව්‍යාපෘති නිලධාරිනී චාමා වනසිංහ මහත්මිය යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති හමුවී එම ඒකකය විසින් සිදුකරනු ලැබූ සේවාවන් ඇතුළත් "මෙහෙවරක අසිරිය" සඟරාවේ මංගල පිටපත යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ප්‍රදානය කළහ.

වසර ගණනාවක් තිස්සේ යුද්ධ හමුදාවේ වීරෝදාර රණවිරුවන්ට, රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහ සිවිල් කාර්ය මණ්ඩලයේ යහපත උදෙසා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සිදුකරනු ලැබූ විශිෂ්ට සේවාව අගය කරමින් යුද්ධ හමුදාධිපති එහිදී සිය හෘදයාංගම සුබපැතුම් පිරිනැමුවේය.









# හැඩිකළ වෙරළ හැඩකරන විරුවෝ

විටෙක ඇ සොඳුරුය. විටෙක ඇ රුදුරුය. නමුත් ඇ අතිශයින්ම සංවේදිය. එනිසාම ඉතා සුළු සිදුවීමකින් වුවද කැළඹී යන්නේය. මේ ගෙවන්නේ ඇ හැඬූ කඳුළින් දිවිගෙවන කාලසීමාවකි. නමුත් තවමත් ඇ නිසොල්මන්ය. සියල්ල දරාගන්නීය. නමුත්. ඇ මේ සියල්ලට පිළිතුරු දෙන දිනයක් උදාවනු ඇත. ඒ දිනය උදාවූ පසු අපට කඳුළු සලන්නට සිදුවනු ඇත.

මේ කියන්නට යන්නේ අපේ මුහුදු තීරයේ වත්මන් කතාවයි.

අපගේ වෙරළ තීරය ගැන අපට යළි ගැඹුරින් කතා කරන්නට සිදුවන්නේ අත්කිසිවක් නිසා නොව කොළඹ වරාය ආසන්නයේ ගිනි ගෙන විනාශ වූ රසායන ද්‍රව්‍ය අඩංගු බහාලුම් රැගත් *'X-press Pearl'* නෞකාවෙන් මුහුදට වැටුණු බහාලුම්, එම බහාලුම්වල අසුරා තිබූ ද්‍රව්‍ය සහ ගිනි ගැනීමෙන් ඇතිවූ සුන්බුන් ශ්‍රී ලංකාවේ වයඹ සිට දකුණු මුහුදු තීරයට ගොඩ ගැසීම නිසා ඇති වූ වෙරළ දූෂණය නිසාවෙනි.

සිංගප්පූරු ධජය යටතේ ලියාපදිංචි වී ඇති මෙම නෞකාව 2021 මැයි මස 15 වන දින ඉන්දියාවේ හසීරා වරායේ සිට නයිට්‍රික් ඇසිඩ් (*Nitric acid*) ටොන් 25 ක් සහ වෙනත් රසායනික ද්‍රව්‍ය සහ රූපලාවන්‍ය ආලේපන ද්‍රව්‍ය සහිත බහාලුම් 1486 ක් රැගෙන යාත්‍රා කරමින් තිබිණි. 2021 මැයි මස 19 වන දින කොළඹ වරාය ආසන්නයට පැමිණි නෞකාව ඒ වෙත ඇතුළුවීමේ අපේක්ෂාවෙන් නාවික සැතපුම් 9.5 ක් දුර මුහුදේ නැංගුරම් ලා තිබියදී ගින්න හටගෙන තිබුණි.

සාගර දූෂණය සම්බන්ධයෙන් 2010 වසරේ එක්රැස් කරන ලද දත්ත ඇසුරෙන් "යුනිවර්සිටි ඔෆ් ජෝර්ජියා" සරසවියට අනුබද්ධව කටයුතු කරන මහාචාර්ය ජේනා ජැම්බෙක්ගේ ප්‍රධානත්වයෙන් 2015 වසරේදී පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කෙරුණි. එම වාර්තාවෙහි අඩංගු සංඛ්‍යාලේඛනවලට අනුව ලොව වෙරළ කලාපය දූෂණය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව පස්වන ස්ථානයට වර්ගීකරණය කර තිබේ. නමුත් මෑතකදී ශ්‍රී ලංකා මුහුදේ සිදුවූ නෞකාව ගිනිගැනීමේ අනතුර නිසා මෙම වර්ගීකරණය වෙනස් විය හැකි බවට සාගරය පිළිබඳ විශ්ලේෂකයෝ



පෙන්වා දෙති. එම වාර්තාවට අනුව ශ්‍රී ලංකාව තුළ වසරකට කළමනාකරණය නොකරන ලද කසල මෙට්‍රික් ටොන් මිලියන 1.59 ක් බැහැර කරන බව ද සඳහන් වෙයි.

සමුද්‍ර පරිසරයෙහි වැදගත්කම පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1992 වර්ෂයේ රියෝද ජැනයිරෝ නුවර පැවති මිහිතල සමුළුවේදී යෝජනා කර 2009 ජුනි 08 වන දින ජගත් සාගර දිනය නිල වශයෙන් ප්‍රකාශයට පත්කර සැමරීමට කටයුතු සූදානම් කරන ලදී. මෙම සංකල්පය මුලින් යෝජනා කරන ලද්දේ 1992 දී කැනඩාවේ සාගර සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ කැනඩාවේ සාගර ආයතනය (*OIC*) විසිනි.

එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්න නිසා ඇතිවිය හැකි තත්ත්වය අප නොසිතන මට්ටමට අතිශයින්ම බරපතල විය හැකිය. මුහුදු ජලයට බැර ලෝහ එක්කාසු වන්නේ නම්, ඒවා හා මුහුදු ජලයේ ඝන අංශු ප්‍රමාණය වැඩිවීම ක්ෂුද්‍ර ජීවීන්ගේ පැවැත්ම අභියෝග යට ලක්කරන්නකි. තවද, මෙය මුහුදු බෙල්ලන්, ස්ටාර් ෆිෂ් ආදි ජලය පෙරීමෙන් ක්ෂුද්‍ර ජීවීන් ආහාරයට ගනු ලබන ජීවීන්ට ද, කොරල් ආදියේ පැවැත්මට, වර්ධනයට හා බෝවීමට ද බලපෑම් කරන්නකි. සියලු සංචරණ මත්ස්‍යයන්ට වාසය කිරීමට නුසුදුසු පරිසරයක් මෙමගින් නිර්මාණය විය හැකිය.

දිය වැල් සමග පැමිණෙන Ph අගය අඩු ආම්ලික ජලය හේතුවෙන් ඇතැම් කුඩා ස්ථානවල කොරල් පර විනාශ වේ. ප්ලාස්ටික් හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු මත්ස්‍යයන්ගේ ශරීරගත වීම තුළින් මසුන් මියයෑම, වර්ධනය හා බෝවීම නැතිවීමත්, ජීවත් වීමට නුසුදුසු පීඩාකාරී පරිසරයෙන් මසුන් ඉවත් වීමත් සිදු වේ. ප්ලාස්ටික් හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් සාගරයට එක්කාසු කරන පළමු රටවල් 5 ඇතුළත ලංකාව සිටියි. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සාගරයට එක් වූ ප්ලාස්ටික් හා නිර්මාණය වන ක්ෂුද්‍ර ප්ලාස්ටික් ක්ෂුද්‍ර ජීවී ක්‍රියාවලිය අකර්මණ්‍ය කිරීමටත්, ඒවා මත යැපෙන විශාල ජීවීන් ප්‍රමාණයක් මෙම පරිසරවලින් අතුරුදහන් වීමටත් හේතුවිය හැකිය.

මේ සියල්ල එසේ සිදුවෙද්දී සාගර වෙරළ පිරිසිදු කිරීමේ වගකීම අදාළ වගකිව යුතු ආයතන සමගින් උරට ගත්තේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවය. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ඩ්‍රෝන ඒකකයේ ඩ්‍රෝන කණ්ඩායමක්, බෝම්බ නිෂ්ක්‍රීය කණ්ඩායමකින් සමන්විත යුද්ධ හමුදා ක්ෂණික විහිදුම් කණ්ඩායමක්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 14 වන රසායනික න්‍යෂ්ටික ජීවවිද්‍යාත්මක සහ විකිරණශීලී ප්‍රතිචාර බලසෙණයේ විශේෂ භටපිරිස් කණ්ඩායමක් සමගින් ආරක්ෂක සේනා මූලස්ථානය - බටහිර යටතේ ස්ථාපිත යුද්ධ හමුදා මූලස්ථානයන්හි භට පිරිස් වයඹ සිට දකුණු වෙරළ තීරයන් දක්වා වෙරළ පිරිසිදු කිරීමේ කටයුතුවල මේ වනවිටත් නිරතව සිටිති. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ උපදෙස් මත ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අධීක්ෂණය යටතේ 14, 61 සහ 58 සේනාංකවල සේනාංකාධිපතිවරුන්ගේ මෙහෙයවීම යටතේ මේ වෙරළ පිරිසිදු කිරීමේ ක්‍රියාන්විතය දියත් කෙරේ.

ඒ යුද්ධ හමුදාව සතුව ඒ වෙනුවෙන් තිබූ සීමිත සම්පත් ප්‍රමාණය උපරිමව යොදවමින්ය. වෙනත් රටවල මේ සඳහා තාක්ෂණික උපකරණ භාවිත කිරීම දැකිය හැකිවුවද ශ්‍රී ලංකාවේ එය සිදුකරනු ලැබුවේ මානව සම්පත යොදාගනිමින්ය. එය යම් තරමක බැරෑරුම් මෙන්ම අවදානම් සහගත තත්ත්වයකි. නමුත් සියලු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද භාවිතා කරමින් මේ කටයුත්ත සඳහා යොදවා සිටින භට පිරිස්වල ආරක්ෂාවද තහවුරු කරමින් සිදුකරන මෙම වැඩසටහනට යුද්ධ හමුදාව ලබාදෙන්නේ සුළුපටු දායකත්වයක් නොවේ.

අපගේ වෙරළ තීරය අපවිත්‍රවන එකම ආකාරය මෙය නොවේ. ධීවර කර්මාන්තය හේතුවෙන් එක්වන දැල්, රෙජිෆෝම් සහ ෆයිබර් කොටස්/ සංචාරක කර්මාන්තය හේතුවෙන් එක්වන ප්ලාස්ටික් බෝතල්, හැඳි ගැරප්පු වැනි කොටස්/ පොලිතීන්, රෙදි, ප්ලාස්ටික් කොටස් වැනි ගොඩබිම ඔස්සේ පැමිණෙන ඝන අපද්‍රව්‍ය මෙන්ම කර්මාන්ත ශාලා මගින් පිටකරන රසායනික ද්‍රව්‍ය, කෘෂි රසායනික ද්‍රව්‍ය, අසූචි වැනි ද්‍රව අපද්‍රව්‍ය වලින්ද සමුද්‍රීය පරිසර දූෂණය සිදුවන අතර ගොඩබිම ඔස්සේ සිදුවන දූෂණය ශ්‍රී ලංකාව තුළ සාගර දූෂණයට වැඩි වශයෙන්ම බලපාන බව වාර්තා වේ.

එබැවින්, සාගරයට අපද්‍රව්‍ය එක් වූ පසු ගත හැකි පියවර සීමාසහිත වන නිසා සාගරයට අපද්‍රව්‍ය එක්වීම වැළැක්වීම සඳහා ප්‍රමුඛත්වය දී සාගරය ආරක්ෂා කරගතයුතු වන්නේ සාගරය යනු මිනිසාගේ කසළ බඳුන නොව සාගරය යනු පෘථිවියේ පෙණහලු බව සිහි තබා ගනිමින්ය.

සටහන :-
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය



# රණවිරු දීරියට සේවා වනිතාවෙන් අත්වැලක්...

සේවයේ නිරත, දිවිපිදූ, රණඝිතයට පත් විරෝදාර රණවිරුවන් වෙනුවෙන්ද ඔවුන්ගේ ඥාතීන් සහ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන්ද සුභසාධන කටයුතු සිදුකිරීමේ අරමුණින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයට ඉකුත් ජූලි 12 වන දින වසර 37 ක් සම්පූර්ණ විය. එම අභිමානවත් දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් මාහැඟි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී, රණවිරු දරුවන් හා සිවිල් සේවක මහතුන්ගේ දරුවන් වෙත ලැප්ටොප් පරිගණක පිරිනැමීම විශේෂ විය. ඒ අනුව 14 (සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සෙ/14ඩී00673 කෝප්‍රල් අජිත් කුමාර ආර්එම්ජ් යන කොනොනි ගේ දියණිය වන ආර්එම් ඉනෂි කුමාරි වෙත හා යුද්ධ හමුදා මූලස්ථානයේ මූලස්ථාන බලඇණියේ රාජකාරියේ නියුතු සිවිල් සේවක කේඑම් අනුර කුලසේකර යන අයගේ පුතණුවන් වන කේඑම් කේෂව කේසාන් වෙත සංකේතාත්මකව ලැප්ටොප් පරිගණක ලබාදෙන ලදී. එසේම, තවත් සිසුන් වෙත පරිත්‍යාග කිරීමට නියමිත ලැප්ටොප් 9 ක් සේවා වනිතා ඒකකය සමග සම්බන්ධතාවයෙන් රෙජිමේන්තු මට්ටමින් බෙදාහැරීමටද කටයුතු යෙදිණ.

තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ යෝජනාවකට අනුව ඉකුත් ජූලි 12 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ සේවය කරන නිලධාරීන් 615 ක්, සෙසුනිලයන් සහ සිවිල් සේවක සේවිකාවන් 3198 ක් සඳහා (සම්පූර්ණ 3813) විශේෂිත ආහාර වට්ටෝරුවකට අනුව දිවා ආහාරය නොමිලේ ලබාදීමද සේවා වනිතා දිනයට සමගාමීව ප්‍රථම වරට සිදුකරන ලදී.



“මෙහෙවරක අසිරිය” සංවත්සර සඟරාවේ මංගල පිටපත යුද්ධ හමුදාධිපතිතුමන් වෙත ප්‍රදානය කිරීමෙන් අනතුරුව එතුමන්ගේ උපදෙස් මත එම සඟරාවේ පිටපත් ආරක්ෂක අමාත්‍යාංශය, යුද්ධ හමුදා මූලස්ථානයේ සියලුම ශාඛා, අධ්‍යක්ෂ මණ්ඩල හා යුද්ධ හමුදාවේ සෙසු අංශ ආයතන වෙතද, ශ්‍රී ලංකා නාවික, ගුවන්, පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථාන වෙතද ලබාදීමට කටයුතු කෙරිණ. එම සඟරා සංකේතාත්මකව බෙදාදීම ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ සුරතින් සිදුවූවාය.



සංවත්සර දිනයේ තවත් සුවිශේෂී අංගයක් ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් පිරිසක් විසින් මුල්ලේරියාව මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ 5 සහ 6 වාට්ටුවල නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් 150 ක් සඳහා විශේෂ දිවා ආහාර වේලක් ලබාදීමටද කටයුතු කරනු ලැබිණ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව...




යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙහි 37 වන සංවත්සරයට සමගාමීව එම සේවා වනිතා ශාඛාව වෙතින් සෙ/152001 ලා/බො ආරියරත්න ජේඑම් යන කොනොනිගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීමට කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව වෙත ලබාදෙන ලදී. එම ලැප්ටොප් පරිගණක යන්ත්‍රය කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමිණී කොටුවේගොඩ මහත්මිය ඇතුළු සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 13 වන දින තත් කොනොනි වෙත භාරදෙන ලදී.



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව යටතේ රාජකාරියේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ සුභසාධනය සැලසීම මෙන්ම සේවා වනිතා ශාඛා ගිණුමට අරමුදල් රැස්කිරීමේ අරමුණින් "සේවා වනිතා ග්‍රීන් ගහර් පොලිටනර් ගොවිපළ" නමින් එළවළු වගා ව්‍යාපෘතියක් ඉකුත් ජූලි 02 වන දින ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි ආරම්භ කරන ලදී. කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමිණී කොටුවේගොඩ මහත්මියගේ සහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ද සහභාගි විය.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව...



ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව මගින් ආබාධිත රණවිරුවන් 06 දෙනෙකු වෙත කොමඩ් සහිත රෝද පුටු 05 ක් හා කොමඩ් කට්ටලයක් ලබාදීමේ මාහැඟි කටයුත්තක් පසුගිය ජූනි 25 වන දින සිදුකරන ලදී. තවද ක්‍රියාන්විත රාජකාරියෙහි නිරතව සිටියදී ආබාධිත තත්වයට පත් විරුවන් පිරිසක් වෙත රුපියල් 700,000.00 ක වටිනාකමකින් යුත් කෘත්‍රිම පාද 02 ක් සහ රෝද පුටු 21 ක් බෙදාදීමේ වැඩසටහනක්ද සිදුකෙරිණ. මෙම සත්කාරක වැඩසටහන් ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරෝමි අමරසේකර මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් සිදුකරනු ලැබූහ.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාව...



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිතුමියගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ සී ගුණතිලක යන අය සහ ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මූල්‍යමය දායකත්වය මත රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/314506 බනි II සම්පත් එන්ඩීසී (ආබාධිත) බලලත් නිලධාරීගේ නිවසේ අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් 15,000.00 ක වටිනාකමින් යුත් ප්‍රේෂණපතක් ඉකුත් ජූලි 27 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය විසින් පරිත්‍යාග කරනු ලැබුවාය.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ගිරෝමි බණ්ඩාර මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 17 වන දින අභිමංසල 3 පාන්ගොල්ල සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීමේ සංචාරයක් සිදුකළාය. එම අවස්ථාව සඳහා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීඑම්පීඩී දිසානායක ආර්ඩබ්ලිව්පී, මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් එල්ඩී පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, නිලධාරීන් ඇතුළු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක්ද සහභාගී වූහ.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව...





ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තුවේ මගපෙන්වීම යටතේ 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය මගින් මුලතිව්හි පිහිටි ලඳනි ළමා නිවාසය වෙත වියළි ආහාර සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 11 වන දින යුධෝපකරණ සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය සුභාෂිණී දොඩම්තැන්න මාරසිංහ මහත්මියගේ උපදෙස් පරිදි සිදුකරන ලදී.

# කාබනික පොහොර නිෂ්පාදනය අරඹයි...






වස විසෙන් තොර කෘෂි කර්මාන්තයක් ගොඩනැංවීමේ අරමුණින් යුතුව රජය විසින් ගෙනයනු ලබන කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලියට රුකුලක් වෙමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ පලාලි යුද්ධ හමුදා ගොවිපළ කේන්ද්‍රකර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කෙරිණ.

මහ කන්නයට අවශ්‍ය පොහොර මෙට්‍රික් ටොන් 3600 ක් නිෂ්පාදනය කිරීමේ අපේක්ෂාව පෙරදැරිව කාබනික පොහොර සැකසුම් භූමියේ සමාරම්භක අවස්ථාව ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූලි 04 වන දින සිදුකරන ලදී. උද්‍යාන විද්‍යා විශේෂඥ කෝලිත වික්‍රමසිංහ සහ ජගත් සෝමතුංග යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගී වෙමින් කාබනික පොහොර සැකසීම පිළිබඳව උපදෙස් සහ විෂය කරුණු ලබාදුන් අතර, රජරට ගොවිපළේ කළමණාකාර වීරසූරිය බණ්ඩාර මහතා විසින් තාක්ෂණික උපකරණ සපයන ලදී.

# මාහැඟි පරිත්‍යාගයක්...








ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ඉල්ලීමකට අනුව වටවල තේ සමාගමේ අනුග්‍රහයෙන් වව්නියාව නොච්චිකුලම් තෙළිඟු ගම්මානයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියලි සළාක මළු 100 ක් බෙදාදීම ඉකුත් ජූනි 05 වන දින සිදුකෙරිණ. මෙහි සම්බන්ධීකරණ කටයුතු වටවල තේ ආයතනයේ ජ්‍යේෂ්ඨ සන්නාම කළමණාකරු අනුරාධා දසනායක මහත්මිය සහ වටවල ආයුර් තේ ආයතනයේ කළමණාකරු අල්ටාෆ් යකුබ් මහතා විසින් සිදුකරන ලදී. මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති, වව්නියාව දකුණ (සිංහල) ප්‍රාදේශීය ලේකම්, වටවල තේ ආයතනයේ නියෝජිතයින් සහ හමුදා සාමාජිකයින් පිරිසක් එක්වූහ.

# සංචාරයක මතක සටහන්...





ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ 22 වන පාබල සේනාංක බළප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූයේය. එහිදී තාවුල්වැව ආධුනික පුහුණු පාසලෙහි සංචාරයක නිරත වූ ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති පුහුණු පාසලේ කාර්ය මණ්ඩලය සමග එහි පහසුකම් සහ අවශ්‍යතාවයන් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

තවද, කුඹුරුපිඩ්ඩි ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිවන 221 වන පාබල බළසේනා මූලස්ථානයේද නිරීක්ෂණ චාරිකාවක නිරත වූ ආඥාපති එම සේනාංක මූලස්ථානයේ සිදුකරනු ලබන ඉදිරි කටයුතු පිළිබඳවද සොයා බැලීය. සිය සංචාරය තුළ ගෝමරන්කඩවල රජමහා විහාරයේ විහාරාධිපති අහුන්ගල්ලේ සිරි සීලවිසුද්ධි හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගැනීමටද ආඥාපති අමතක නොකළේය.

# කිළිනොච්චියේ ඇඟලුම් කම්හල් කාර්ය මණ්ඩලයටත් කොවිඩ් එන්නත්...





ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ආරක්ෂක සේනා (කිලිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ අධීක්ෂණය යටතේ කිලිනොච්චි ප්‍රදේශයෙහි ඇති "මාස් ඉන්ටිමේට්ස් විඩියල් " සහ "වානවිල්" ඇඟලුම් කම්හල්වල කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ් - 19 එන්නත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 24 සහ 25 යන දෙදින තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම අවස්ථාවට 66 වන සහ 57 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරුද සහභාගී වූහ.

# සේනාංක සංචාරයක...



ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජූනි 26 වන දින එම මූලස්ථානය යටතේ ස්ථාපිත 64, 68 සහ 59 වන සේනාංක බලප්‍රදේශවල සංචාරයන්හි නිරතවිය.



එහිදී, 64 වන සේනාංකයට අයත් මුත්තියන්කට්ටු බළඇණි පුහුණු පාසලේ සහ වසන්තිපුරම් ආධුනික පුහුණු පාසලේ ද සංචාරය කළ ආඥාපති 68 වන සේනාංක බල ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ නවනිවාස අවශ්‍යතාවයන්, මාර්ගබාධක රාජකාරී සහ මුරකුටිවල සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයන් පිළිබඳවද සොයාබැලීය.

එසේම, 59 වන සේනාංකයේ පාබල අවශ්‍යතා පිළිබඳවද ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය. මෙම අවස්ථාවට 68 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේආර්කේකේටී බණ්ඩාර ආර්එස්පී යූඑස්පී, 59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී, 64 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී ද එක්වූහ.

# ප්‍රථම නිල සංචාරය...






ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් පසු සිය ප්‍රථම නිල සංචාරය ඉකුත් ජූලි 09 වන දින 61 වන පාබල සේනාංක බලප්‍රදේශය තුළ සිදුකරන ලදී. එහිදී එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීජී හේවගේ ආර්එස්පී ගේ ගෞරවනීය පිළිගැනීමෙන් අනතුරුව බලප්‍රදේශයේ බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡාවකටද එක්වූහ.

තවද, ගාල්ල අක්මීමන රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ස්ථාපනය කර ඇති අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය නිරීක්‍ෂණය කිරීමටද එක්වූ ආඥාපති 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජ්‍යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් එම බලසේනාවේද සංචාරය කරන ලදී. එහිදී ප්‍රදේශයේ ආරක්‍ෂක තත්වය සහ අනෙකුත් කටයුතු පිළිබඳ සොයා බැලූ ඔහු මාතර මාපලාන කෘෂිකර්ම පීඨයෙහි ස්ථාපනය කර ඇති නිරෝධායන මධ්‍යස්ථානය හා 3 (සෙව්) ගැමුණු හේවා බලඇණියෙහිද නිරීක්‍ෂණය කරන ලදී.



# සේනාංක සංචාරයක්...

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජුලි 14 වන දින ශ්‍රී දළදා මාලිගාව වැඳපුදා ගනිමින් 11 වන පාබල සේනාංකයේ නිරීක්ෂණ සංචාරයක නිරතවන ලදී. එහිදී ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ඇති 11 වන පාබල සේනාංක මූලස්ථානයෙහි නවතමයෙන් ඉදිවෙමින් පවතින පල්ලෙකැලේ නව යුද්ධ හමුදා රෝහලද ඔහු විසින් නිරීක්ෂණය කළේය.

මෙම අවස්ථාවට 11 වන පාබල සේනාංක මූලස්ථානයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 111 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීජේකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ඒකක අණදෙන නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.





# පුනරින් සටනින් දිවිපිදූ
# අමරණීය විරුවා



නි/61672 ලුතිනන් කේඩබ්ලිව්ටී නිශ්ශංක පීඩබ්ලිව්වී

දියකර හරින්නට මෙන් ගොරහැඩි ගල්පර හා පොරබදන දිය රැළි බිඳි වෙරළ සිපගන්නේ කිරි තැවරුන පෙණකැටි දසත විහිදුවාලමිනි. පෙන බුබුළු අතර නලියන සඳකැන් රිදී සළුවක් සේ හාත්පසම වසා ගොසිනි. දරුවා උපන් වේලාව වර්ෂ 1971 ක් වූ වප් මස 21 වන දින රාත්‍රී 1124 ලෙස සටහන් පොත් අතර සනිටුහන් වන්නේය.

කොළොම්පුර, වැල්ලවත්ත වෙසෙන කාරියවසම් වික්‍රමආරච්චිගේ කරුණාරත්න සහ කටුගම්පලගේ පුනාසිරි දයාවති කැදල්ලට දෙවන දරුවා ලෙස කාරියවසම් වික්‍රමආරච්චිගේ තිලක් නිශ්ශංක පුත් කුමරු එකතු වන්නේ සතුට පොදිබැඳගෙන එමිනි. සිය වැඩිමහල් සොහොයුරියගේත්, දයාබර දෙමව්පියන්ගේත් පමණක් නොව ඥාතීන් මෙන්ම අසල්වැසියන් බොහෝ දෙනෙකුගේත් සුරතලා බවට පත්වන කුඩා තිලක් නිශ්ශංකගේ දඟකාරකම් හා ක්‍රියාශීලී බව "හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ" යන පිරුළට සාක්ෂි දරන බවට කිසිවෙකු කල්පනා නොකරන්නට ඇත.

තිලක් නිශ්ශංක සිප්සතර හැදෑරීම සඳහා කොළඹ ඩීඑස් සේනානායක විද්‍යාලය වෙත ඇතුළත් වන්නේ 1977 වර්ෂයේදීය. විද්‍යාලයීය රග්බි කණ්ඩායම, පාපන්දු කණ්ඩායම වසර ගණනාවකදීම නියෝජනය කළ තිලක් නිශ්ශංක ක්‍රීඩකයා එහිදී මළල ක්‍රීඩාවේදීද විශේෂ දක්ෂතා දක්වා ජයග්‍රහණ රැසක් ලබාගනිමින් සිය පාසලට ඉමහත් ගෞරවයක් අත්කරදීමට

සමත් වන්නේය. එම වකවානුවේ ඔහුගේ විදුහල්පතිවරයා වන්නේ කීර්තිමත් ගුරු පියෙකු වූ ආර්අයිටී අලස් මහතාය.

සිසු දරුවන් පිළිබඳව දුරදක්නා අවබෝධයකින් පසුවන ඔහු තිලක් නිශ්ශංක සිසුවා සම්බන්ධයෙන් අදහස් පළකරන්නේ මෙලෙසිනි. "නිශ්ශංක දරුවා සෑම අංශයකදීම ඉතා ඉහළින් කැපීපෙනෙන විශිෂ්ට ගණයේ ශිෂ්‍යයෙකි. ඔහු වඩාත් දක්ෂ ඉගෙනීමටද එසේත් නොමැතිනම් ක්‍රීඩාවටද කියා වෙන් කරන්නට බැරි තරමටම ඔහු ඒ දෙකටම එක ලෙසටම දක්ෂය. ඕනෑම කටයුත්තකදී සාර්ථක ප්‍රතිඵල අත්කරදුන් මේ දරුවා මගේ විතරක් නෙවෙයි, විදුහලේ ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම ආදරය දිනාගත් දීප්තිමත් දරුවෙක්". පාසල් අධ්‍යාපනය මෙන්ම දහම් අධ්‍යාපනය කෙරෙහිද විශේෂ ඇල්මක් දක්වූ තිලක් නිශ්ශංක දරුවා පහළ ඉඹුල්ගොඩ ශ්‍රී විජය දහම් පාසලට ඇතුළත්ව එහි ශිෂ්‍ය නායක පදවියක් ද ඉසිලූ අතර, දහම් පාසල් අවසන් විභාගයද ඉහළින්ම සමත් වන්නේය. දහම් පාසල් අධ්‍යාපනය ලබන අතරතුරදී කථික, දහම් දැනුම, චිත්‍ර තරඟ මෙන්ම දහම් පාසල් සිසු නිපුනතා ඇගයීම්වලදීද විශේෂ කුසලතා පෙන්නුම් කොට ජයග්‍රහණ රාශියක් හිමිකරගැනීමටද ඔහු දක්ෂයෙක් විය. 1987 වර්ෂයේ තිලක් නිශ්ශංක ඇතුළු කණ්ඩායම නිර්මාණය කරන ලද සංසාර චේතනා නාට්‍යය දහම් පාසල් නාට්‍ය තරඟාවලියේදී ප්‍රථම ස්ථානය ලබාගත් අතර එහි තිලක් නිශ්ශංක ගේ භූමිකාව කාගේත් කතාබහට ලක්වන්නේ මහත් ඉහළින්ය.

චිත්‍ර කලාව කෙරෙහි විශේෂ කුසලතාවක් දක්වූ තිලක් නිශ්ශංක 1988 වර්ෂයේ දහම් පාසල මගින් ඉදිරිපත් කළ වෙසක් තොරණෙහි චිත්‍ර ශිල්පියා ලෙස කටයුතු කොට තම හැකියාව මුළු ප්‍රදේශයටම කියාපෑමට සමත් විය. දහම් පාසලේ ප්‍රධානාචාර්ය හා දිස්ත්‍රික් ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරී පූජ්‍ය තෝරපිටියේ ආනන්ද නායක හිමියන් නිශ්ශංක පිළිබඳව අදහස් දක්වන්නේ මෙලෙසිනි. "දහම් පාසලට ඇතුළත් වූ දින සිටම විනයගරුක දරුවෙකු වූ තිලක් නිශ්ශංක බොහෝ අංශවලින් හපන්කම් පෙන්වූ දරුවෙකි. දහම් දැනුම, කථික, රචනා වගේ තරඟවලදී ඔහු ජයග්‍රහණ රැසක් අත්කරදීම මෙන්ම අප දහම් පාසලට අත්කරදුන් කීර්තියද අපට හැමදාම මතක තියෙනවා. නිශ්ශංක පුතා අතින් චිත්‍රයට නැගුනු අඩි 45 උස තොරණ අපි හැමෝම විස්මයට පත්කළා. ඒ දක්ෂ දරුවා අනාගත පරපුරේ ඇගයීමට ලක්කරන්න හිතාගෙනයි ඔහුගේ පිළිරුවක් අප විහාරස්ථානයේ ඉදිකළේ". 6 වන ශ්‍රේණියේ සිටියදීම එනම්, 1983 වර්ෂයේ පාසල් ශිෂ්‍යභට කණ්ඩායමට ඇතුළත් වන තිලක් නිශ්ශංක 1989 හා 1990 වර්ෂවල විද්‍යාලයීය ශිෂ්‍යභට කණ්ඩායමේ සැරයන් තනතුරට පත්වන්නේ ඔහු තුළින් ඉස්මතු වූ නායකත්වය, සාමූහිකත්වය හා පිරිස් පාලනය ආදී හැකියාවන් වලින් පිරුණු විශිෂ්ටයෙකු වන හෙයිනි.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් විශිෂ්ට සම්මාන 05 කින් හා සම්මාන සාමාර්ථ 03 ක්ද සහිතව ඉහළින්ම සමත්වන තිලක් නිශ්ශංක වාණිජ්‍යය අංශයෙන් අ.පො.ස (උ/පෙළ) විෂය ධාරාව තෝරාගනිමින් අධ්‍යයන කටයුතුවල නියැලෙන්නේය. ත්‍රස්තවාදයෙන් වැනසෙන රට ගොඩග ැනීමේ අරමුණ සිතෙහි මුල්බැසගෙන සිටි තරුණ තිලක් නිශ්ශංක ඒ සඳහා පෙරමුණ ගැනීම පිණිස 1990 ක් වූ සැප්තැම්බර් මස 07 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බලසේනාවට කෙඩෙට් නිලධාරියෙකු ලෙස එක්විය. පකිස්ථාන ආරක්ෂක විද්‍යාපීඨය මගින් දක්ෂ ලෙස යුද පුහුණුව ලැබූ ඔහු එහිදී පාඨමාලාවේ සියලුම කෙඩෙට් නිලධාරීන් අභිබවා "දක්ෂතම වෙඩික්කරු" ලෙස කිරුළ දරන්නේ අප රටටද ඉමහත් කීර්තියක් අත්කර දෙමිනි. 1991 වර්ෂයේ දෙවන ලුතිනන් වරයෙක් වශයෙන් අධිකාරියට පත්වන නි/61672 2/ලුතිනන් තිලක් නිශ්ශංක ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සටන්කාමී රෙජිමේන්තුවක් වන ගජබා රෙජිමේන්තුවේ 3 වන බළඇණියට ඇතුළත්ව භාණ්ඩාගාර නිලධාරියෙකු වශයෙන් සටන් පෙරමුණට එක්ව සිය ජාතික මෙහෙවරට මුලපිරිය. නායකත්වය මෙන්ම හටපිරිස් හැසිරවීම පිළිබඳව සහජ කුසලතාවයකින් පිරිපුන් මෙම තරුණ නිලධාරියා සිය ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ මෙන්ම සිය කණ්ඩයේ සාමාජිකයන්ගේද නිරන්තර ඇගයීමට පාත්‍රවිය.

උතුරුකරයේ වෙත්තලකර්නි, පලාලි, අලිමංකඩ හා මාදගල් ආදී ප්‍රදේශවල ත්‍රස්තවාදීන්ට එරෙහිව සිදුකළ සංග්‍රාමවලදී සිය උපායශීලී යුද ඥානය උපයෝගීකොට හටපිරිස් හසුරුවන්නෙකු වශයෙන් විශේෂ දක්ෂතා දක්වන ඔහු තම

**කිසිවිටෙකත් පසුබැසීමට අකැමැති රණකාමී තිලක් නිශ්ශංක දරුණු සතුරු ප්‍රහාරය අතරේම තම සෙබළුන් සමීපයට දිවයමින් ඔවුන් දිරිගන්වමින් සිටියදී සතුරු වෙඩි උණ්ඩයක් ඔහුගේ දකුණු පාදය පසාරු කරන්නේ ඊට බරපතල ලෙස හානි සිදුකරමිනි. එහෙත් ඉන් තම අභිප්‍රාය අත් නොහරින, රණවිරු තිලක් නිශ්ශංක සිය අපහසුතාව හා වේදනාව ඉවත දමා තව තවත් ධෛර්ය සම්පන්නව තම සෙබළුන් සටනෙහි මෙහෙය වන්නට විය. තත්වය තව තවත් දරුණු විය. තුවාල ලත් තම සගයින්ගේ කෙඳිරිලි හඬ ඔහු කම්පනයට පත්කළත් ජීවිත බේරාගැනීමට නම් සතුරන් විනාශකළ යුතු යැයි යන දැඩි තීරණය කෙරෙහි ඔහු පොළඹවන්නට විය.**

සටන් කෞශල්‍යය මනාලෙස විදහා පෙන්වමින් වන්නි වික්‍රම I, II, බලවේගය I, භූමිකම්පා ක්‍රියාන්විතය හා අවසන් වශයෙන් උතුරුකරය පුරා විවිධ ක්‍රියාන්විතයන්හිදී සටන් පෙරමුණෙහි යුද වැදී සිටියදී ත්‍රස්ත ප්‍රහාරයට ලක්වීමේ අවදානමට ගොදුරුව පවතින පූනරින් කඳවුර සුරක්ෂිත කරලීමේ භාරදූර කාර්යය සඳහා 1991 වර්ෂයේදී කඳවුරු බැඳගෙන සිය බළඇණිය සමග එක්විය.

හුදෙකලා කඳවුරක්ව පැවති එම කඳවුරට විවිධ යුද්ධෝපක්‍රම අත්හදා බලමින් ප්‍රහාර එල්ල කිරීමට ත්‍රස්තවාදීන් ප්‍රයත්න දැරීම නිසා සෑම තත්පරයක්ම අවධානම කැටිව ගෙවීයන්නට විය. වර්ෂ 1993 ක් වූ නොවැම්බර් මස 11 වන දින අළුයම 0130 ට පමණ වෙඩි වරුසාවක්ද සමග දවැන්ත ත්‍රස්ත ප්‍රහාරයක් කඳවුරට එල්ල වන්නට විය. එම ත්‍රස්ත ප්‍රහාරයට ලක්වන්නේ රණවිරු තිලක් නිශ්ශංක සමග සිය ඛණ්ඩය ස්ථානගතව සිටි ප්‍රදේශයයි. ඇසිපිය හෙලන කාලයද පරදවා ක්‍රියාත්මක වූ රණවිරු තිලක් නිශ්ශංකගේ අණදීමෙන් තම ඛණ්ඩයේ සියලු සෙනින්ගේ ගිනිඅවිවලින් ක්ෂණිකව ඉගිල ගිය වෙඩි උණ්ඩ වරුසාවක් ත්‍රස්තවාදීන් සොයා යාමත් සමග ත්‍රස්තයන්ට සිය අදහස අතහැර දමා පලායාමට සිදුවිය. මුළු පරිසරයම නිහඬය, අන්ධකාරය. තවමත් අඳුරු සෙවණැල්ලක්ව කාල වර්ණයෙන් මුළු ප්‍රදේශයම වසාගෙනය. අවධානමක ඉවවැටී සිටි රණවිරු තිලක් නිශ්ශංක ගතයුතු ඉදිරි පියවර යටි සිතින් සැලසුම් කළේය. කාලය, තත්පර විනාඩි බවට පෙරළී යද්දී යළිත් රුදුරු ත්‍රස්ත ප්‍රබල අවි එකවර ක්‍රියාත්මක වෙමින් දරුණු ප්‍රහාරයක් රණවිරු තිලක් නිශ්ශංකගේ ඛණ්ඩය ස්ථානගත වී සිටි ප්‍රදේශයටම එල්ලවිණි. එය පෙර ප්‍රහාරයට වඩා ප්‍රබල මෙන්ම දරුණු වන්නට විය.

තම ආරක්ෂක ප්‍රදේශයට ඉදිරිපසින් මෙන්ම පසුපසින්ද දැඩි සතුරු ප්‍රහාරයක් එල්ලවන බව ක්ෂණිකව වටහාගත් මෙම තරුණ රණකාමී නායකයා තම ජීවිත අවධානම කිසිසේත් නොසලකා එහාමෙහා පියඹා යන සතුරු වෙඩි උණ්ඩ අතරේම තම සෙබළුන් වෙත යමින් සටන මෙහෙයවීය. සතුරු ප්‍රහාර ද එන්න එන්නම දරුණු විය. ඔවුන්ගේ මෝටාර්, ආර්පීජී හා බර අවිවලින් එල්ලවන ප්‍රහාරයෙන් තම සෙබළුන්ගේ බංකර් කඩා වැටෙමින් ඔවුන්ගේ ජීවිත බිලිගන්නා අයුරු රණවිරු තිලක් නිශ්ශංකගේ තියුණු ඇසට හසුවිය. බංකරයෙන් බංකරයට දිවයමින් තත්වය සොයා බලා තම සෙබළුන් දිරිගැන්වූවද තත්වය තව තවත් දරුණු විය.

මේ පිළිබඳව තම මූලස්ථානය වෙත දැනුම් දුන්නද එයද ඒ වනවිට ත්‍රස්ත ප්‍රහාරයකට ගොදුරුව සිටි හෙයින් තම ඛණ්ඩයට ආධාරක හටපිරිස් ගෙන්වා ගැනීමට අපහසු බැව් ඔහුට වැටහිණි.

කිසිවිටෙකත් පසුබැසීමට අකමැති රණකාමී තිලක් නිශ්ශංක දරුණු සතුරු ප්‍රහාරය අතරේම තම සෙබළුන් සමීපයට දිවයමින් ඔවුන් දිරිගන්වමින් සිටියදී සතුරු වෙඩි උණ්ඩයක් ඔහුගේ දකුණු පාදය පසාරු කරන්නේ ඊට බරපතල ලෙස හානි සිදුකරමිනි. එහෙත් ඉන් තම අභිප්‍රාය අත් නොහරින, රණවිරු තිලක් නිශ්ශංක සිය අපහසුතාව හා වේදනාව ඉවත දමා තව තවත් ධෛර්ය සම්පන්නව තම සෙබළුන් සටනෙහි මෙහෙය වන්නට විය. තත්වය තව තවත් දරුණු විය. තුවාල ලත් තම සගයින්ගේ කෙඳිරිලි හඬ ඔහු කම්පනයට පත්කළත් ජීවිත බේරාගැනීමට නම් සතුරන් විනාශකළ යුතු යැයි යන දැඩි තීරණය කෙරෙහි ඔහු පොළඹවන්නට විය.

අවසන් හුස්ම හෙළූ තම සෙබළුන්ගේ හාගෙට පියවී පැවති දෑස් ඔහු දෙසා බලා පවසනුයේ රුදුරු සතුරාගේ හිස්ගෙඩි සුනුවිසුනුකර දමන ලෙස යැයි ඔහුගේ සිතට තදින් දැනෙන්නට ඇත.

උණ්ඩ ලෙයින් තෙත්වූ තම පාදයෙන් මතුවන දැඩි වේදනාව පලවා හැරී මෙම සටන්කාමී නිලධාරියා තම අවිය සතුරා දෙසට මානා එහි ට්‍රිගරය තදින් මිරිකා සිටියද තම අවිය ගොළු වී ඇති බව ඔහුට වැටහිණ. එහි පතරොම් ගැබෙහි උණ්ඩ අවසන් බව තේරුම් ගැනීමට ඔහුට අපහසු නොවිය. ඒ සමග තමා ඉදිරියෙන් සතුරු සමූහයක් සිය සෙබළුන් දෙසට ළඟාවෙමින් සිටිනු දුටු ඔහුට ඊළඟ නිමේෂයේදී සිදුවීමට යන විනාශය මැවී පෙනෙන්නට විය.

තම සොහොයුරිය, මව හෝ පියා, ඔහුගේ සිත අද්දර නොමැත. තමා සමග අනතුර බෙදාගත් තම සෙබළුන්ගේ මුහුණු ඔහුගේ සිත පුරා අරක්ගෙනය. එතෙක් වේලා තම දෑසට හිරවී සිටි ගිනි අවිය පසෙකට විසිකළ ඔහුගේ දෑත් අසුරු සැණෙකින් දිවගියේ තමාගේ පැසෙහි දෙපස තුඩා සාක්කු යුගල තුළටය. එහි සුරක්ෂිතව බහා තිබූ අත් බෝම්බ දෙක රණවිරු තිලක් නිශ්ශංකගේ දෑතේ කිටි කිටියේ හිරවිය. වහා මුවගට ළංකර ගන්නා බෝම්බ දෙකෙහි ආරක්ෂිත ඇණ ඔහුගේ මුවගත් දෑත් අතරත් හිරවී පසෙකට විසිවිය. පිරිස අතහැර යෑම හෝ සතුරන් අතට තමන් පත්වීම අභීත විරුවෙකු හට උචිත නොවන්නක් බැවින් තළියන දැසින් තියුණු බැල්මක් හෙළූ මෙම රණකාමියා තම සෙබළුන් ගොදුරුකර ගන්නට සැරසෙන සතුරු සමූහය වෙත කේසර සිංහයෙකු සේ කඩාපනිනු ලැබුවේ සිය ඇඟිලි අතර ගිනියම් වෙමින් පැවති බිහිසුණු බෝම්බ දෙක පුපුරුවා ගනිමිනි. හෙණ හඬක් පතුරුවමින් නැඟුණ ගිනිජාලාව සමග සතුරු සමූහය සුනුවිසුණු බවට පත්වද්දී ලක්මව තම වීරෝදාර සෙබළ පුතෙකුගේ නිසල සිරුර තම ඇකයේ හොවාගන්නේ තම සෙබළුන්ගේ ජීවිතාරක්ෂාව පිණිස සහ මාතෘභූමියේ අභිමානය රැකදීම පිණිස දිවි පරදුවට තැබූ වික්‍රමාන්විත රණකාමියෙකු වූ දෙවන ලුතිනන් තිලක් නිශ්ශංක රණවිරුවා දිනූ දේශයට අභිමි කරවමිනි.

ස්වකීය ජීවිතයද තම සෙබළුන්ගේ ජීවිතවල ආරක්ෂාවටද සිදුවිය හැකි අනතුරු උපද්‍රව ගැන මොහොතකුදු නොසිතා සිය බලඇණියේ අරමුණු මෙන්ම සමස්ත යුද්ධ හමුදාවේම අරමුණු ඉටුකිරීමෙහි ලා වික්‍රමාන්විත වූද, අභීතභාවය ප්‍රදර්ශනය කරන්නා වූද ක්‍රියාවන්හි පෞද්ගලිකවම යෙදීම හේතුකොට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිනී වූද සේනාධිනායිකා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් නි/61672 2/ලුතිනන් කේ ඩබ්ලිව්ටී නිශ්ශංකගේ සේවය ඇගයීම වස් 2/ලුතිනන් නිලයේ සිට ලුතිනන් නිලය දක්වා නිල උසස් කර, රණකාමී නිලධාරියෙකුට දිය හැකි වටිනාම හා උසස්ම සම්මානය වන පරම වීර විභූෂණයෙන් පිදුම් ලැබීය.



යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත 'උත්තමාචාරය' ග්‍රන්ථයෙනි.

# ඓතිහාසික සෙවණට අභිමන් පිවිසුමක්...



අභිනවයෙන් ඉදිවන යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථාන පරිශ්‍රය වෙත මෙතෙක් අඩුපාඩුවක්ව පැවති පිවිසුම් දොරටුව සඳහා මුල්ගල තැබීම ඉකුත් ජුනි 02 වන දින සිදුකෙරිණ. එහිදී ස්වේච්ඡා බලසේනා සේනාධිධායක මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී විසින් එහි මංගල පස්පිඩැල්ල කපා ශිලා ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. මෙම අවස්ථාවට ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාධිධායක මේජර් ජෙනරාල් ජේඩීසීජී ජයසිංහ කේඑස්පී කේඑස්වී ඇතුළු නිලධාරීන් රැසක් ද සහභාගී වූහ.

එදා මෙදාතුර ඓතිහාසික විරුවන්, ජාත්‍යන්තරය දිනූ ක්‍රීඩකයන් ආදී නොමැකෙන මතක සටහන් තැබූ චරිත බිහිකළ වසර 140 ක ඉතිහාසයක් ඇති යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙහි මෙම මූලස්ථාන පිවිසුම් දොරටුව ඉදිවීම හරහා එහි අභිමානය හා විචිත්‍රත්වය තවදුරටත් ඉහළ නැංවෙනු නොඅනුමානය.

# නිසට සෙවණක්...





ආරක්ෂක සේනා (කිලිනොච්චි) ආඥාපති ගේ උපදෙස් මත ක්‍රිෂ්ණපුරම් ග්‍රාමයේ අඩු ආදායම්ලාභී පවුලක් වෙත නිවසක් ඉදිකර ප්‍රදානය කිරීම ඉකුත් ජුලි 05 වන දින සිදුකෙරිණ. 573 වන පාබල බලසේනාවේ මූලාධාර මත ඉදිවූ මෙම නිවස වෙනුවෙන් 9 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ භටපිරිස් ශ්‍රම දායකත්වය සැපයූහ. නිවස පිරිනැමීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා (කිලිනොච්චි) ආඥාපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහභාගී විය.

"මෙරට තිස්වසක යුද ඉතිහාසයේ සන්ධිස්ථානයක් වූ අලිමංකඩ සිදුවීම හරහා පරම වීර විභූෂණයෙන් පිදුම් ලැබූ ප්‍රථම වීර සෙබළා ලෙස හසලක ගාමිණී කුලරත්න ඉතිහාසයට එක්විය"



# හසලක විරුවාට තිස්වසරක්...





6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් මියගිය කෝප්‍රල් ගාමිණී කුලරත්න පීඩබ්ලිව්වී රණවිරුවාගේ 30 වන සැමරුම් උත්සවය ඉකුත් ජූලි 14 වන දින අලිමංකඩ පිහිටි ගාමිණී කුලරත්න ස්මාරකය අභියස මහත් අභිමානවත්ව පැවැත්විණ. හසලක විරුවා 1991 ජූලි 14 වන දින අලිමංකඩදී ත්‍රස්තවාදීන් විසින් එවන ලද පුපුරණ ද්‍රව්‍ය සහිත ඩෝසරය, දිවි පරදුවට තබා පුපුරවා හැර මෙලොවින් සමුගත්තේය.

66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීජීපී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී ගේ මගපෙන්වීම මත 662 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එච්එල්සී ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරුණු මෙම සැමරුම් උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති සහ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය.











# ගුවන් සංක්‍රමික පුහුණු පාඨමාලාව - අංක 23...

53 වන පාබල සේනාංකය යටතේ පාලනය වන නිකවැව පිහිටි ගුවන් සංක්‍රමික පුහුණු පාසලේදී ගුවන් සංක්‍රමික පුහුණු පාඨමාලා අංක 23 පසුගිය ජූලි 7, 8, 9 යන තෙදින තුළ හිඟුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරේදී පැවැත්විණ. 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී එම කටයුතු අධීක්‍ෂණය කිරීමේ නිරීක්‍ෂණ සංචාරයක නිරත විය.

# නිරීක්ෂණ සංචාරයක්...



ආරක්ෂණ සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූලි 21 වන දින 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය හා 8 වන ශ්‍රී ලංකා සේවා බලකාය යන ඒකකයන්හි නිරීක්ෂණ සංචාරයක නිරත වන ලදී.

එහිදී, එම ඒකකයන්හි රාජකාරියේ නියුතු නිලධාරීන් හා සෙසුනිලයින් ඇමතූ ආඥාපතිතුමන් ඔවුනගේ පාලන අවශ්‍යතා වෙනුවෙන් විසඳුම් ලබාදීමටද ක්‍රියා කළේය.




# පාඨමාලා ජය ලබමින්...



ඉකුත් ජූනි 22 වන දින විසිරයන ලද යුද්ධ හමුදා පුහුණු පාසල - මාදුරුඔය වෙතින් පවත්වනු ලැබූ විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලා අංක 71 සඳහා 23 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව වෙතින් සෙ/367340 සැරයන් ගුණරත්න බණ්ඩාර බීඩබ්ලිව්එස් ආර්එස්පී, සෙ/375890 කෝප්‍රල් රත්නායක ආර්එම්එන්පී, සෙ/373523 ලා/කෝ ධර්මකීර්ති යූජීඒඅයි, සෙ/379202 ලා/කෝ ප්‍රදීප් කුමාර ඩබ්ලිව්කේජේ, සෙ/376385 රසෙ අමරසිංහ එච්ජීඑම්එන්, සෙ/382583 රසෙ ප්‍රියන්ත ඩීඑම්ජී, සෙ/383817 රසෙ චන්දිම ඩබ්ලිව්ජීකේ, සෙ/384244 රසෙ අබේරත්න එම්ජීකේබී සහ සෙ/385096 රසෙ සඳකැලුම් ඒඑම් යන සෙනීන් සහභාගී වූහ. එම පාඨමාලාවේ දක්ෂතම සෙබළා වශයෙන් සෙ/375890 කෝප්‍රල් රත්නායක ආර්එම්එන්පී තේරී පත්විය.

# අමතර ආදායම් උත්පාදන ව්‍යාපෘතියක්...



57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මගපෙන්වීම යටතේ එම බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්වය නංවාලීම සඳහා වූ අමතර ආදායම් උත්පාදනය කිරීමේ ව්‍යාපෘති රැසක් ආරම්භ කොට ඇත. ඊට කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, මී මැසි පාලනය වැනි ව්‍යාපෘති ඇතුළත්ය. ඒ අනුව 7 වන ශ්‍රී ලංකා පාබල හමුදාව, 9 වන විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 9 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා එළවලු සහ පලතුරු පැළ බෙදාදීමක්ද, ධීවරයින් 187 දෙනෙකුගෙන් සමන්විත පවුල් 52 ක් සඳහා ඩ්‍රයිආරුකුලම් සහ විශ්වමඩු වැව් ඉවුරේදී මිරිදිය මසුන් මුදාහැරීමේ වැඩසටහනක් ද සංවිධානය කරන ලදී. 571, 572 සහ 573 වන පාබල බලසේනාධිපතිවරුන්ගේ අධීක්‍ෂණයෙන් මෙම ව්‍යාපෘති සංවිධානය කරනු ලැබූහ.

# පූජා සත්කාරයක්...



56 වන පාබල සේනාංක බලප්‍රදේශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි ආහාර හා පිසින ලද ආහාර පාර්සල් බෙදාදීම ඉකුත් ජූනි 15 වන දින සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා 563 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීජී පෙරේරා ආර්එස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගී වන ලදී.

# ආගමික ස්ථාන වෙත යුද්ධ හමුදාවෙන් පරිත්‍යාග...



65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්ටී දිසානායක ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් සහ මගපෙන්වීම යටතේ කැනඩාවේ වෙසෙන සෙන්ඩර්ස් ජයතිලක මහතාගේ ධන පරිත්‍යාගයෙන් රට තුළ උද්ගතව ඇති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්ව සිටින ආගමික සිද්ධස්ථාන වෙත වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පොසොන් උත්සවයට සමගාමීව ඉකුත් ජූනි 24 වන දින ක්‍රියාත්මක කරන ලදී.

මෙම වියළි සලාක බෙදාදීම ඇටබගස්කඩ රජමහා විහාරය, පිරප්පන් මඩුව පඤ්ඤානන්ද විහාරය, සැලලිහිණි ශ්‍රී සිද්ධාසිරි මහා විහාරය, සැලලිහිණිගම ශ්‍රී සුධර්මාරාම මෙහෙනි ආරාමය, නන්දමිත්‍ර ගම සුජාතාරාම මෙහෙනි ආරාමය සහ කොක්එලිය ශ්‍රී බෝධි මළුව විහාර මුල් කරගෙන සිදුකරන ලදී.

# මහා භාරතයෙන් හෙළිවන සංග්‍රාම නීතිය



සංග්‍රාමයක් පවතින අවස්ථාවලදී එහි යම් නීති රීති සම්ප්‍රදායන් පවතින බව යුධ සංග්‍රාමයට අවතීර්ණ වන බොහෝ පාර්ශ්වයෝ නොදනිති. ලෝකයේ සංග්‍රාමයන් ආරම්භවීම ඉතා පැරණිය. එය කොතෙක්ද යත්, පෘතුවියේ ආරම්භක වකවානුව තෙක්ම දිව යන්නේය. එසේ නම් සංග්‍රාම නීතියද එතරම්ම පැරණියැයි කිව හැක්කේය. සතුරෙකු අත්අඩංගුවට පත්වූ පසු ඔහු මරා නොදැමිය යුතු බවත්, ඔහුට මානුෂිකව සැළකිය යුතු බවත්, ඈත අතීතයේ පවා හමුදා ප්‍රධානීන් දැනසිටියහ. ඒ පිළිබඳව තම සෙබළුන් දැනුවත් කළහ. මේ අයුරින් ක්‍රමානුකූලව සංග්‍රාමයේ නිරතවූවන්ගේ අත්දැකීම් තුළින් පෝෂණය ලැබූ සංග්‍රාම නීතිය කාලානුරූපව විකාශනය වෙමින් වර්තමානයේදී ජාත්‍යන්තර වශයෙන් යම් රටකට, රාජ්‍යකට සෘජුවම බලපෑමක් කළහැකි නීතියක් බවට පත්වී ඇත.

සංග්‍රාම නීතියේ අතීතය පිළිබඳව කරුණු විමසා බැලීමේදී එයට දිය හැකි ඉතා වටිනා ප්‍රායෝගික නිදසුනක් මහා භාරතයෙන් සොයාගත හැකිය. ලෝක ඉතිහාසයේ සංග්‍රාම නීතිය අර්ථවත් කරන සුවිශේෂී නිදසුනක් වන්නේ මහා භාරත වංශ කථාවේ කුරුක්ෂේත්‍ර යුද්ධයයි. සංග්‍රාම නීතිය හඳාරන්නට මෙන්ම නීතිගරුක බොහෝ යුධ නායකයින්ට එයින් ලබාගතහැකි පිටුවහල ඉමහත්ය.

> "සතුරෙකු අත්අඩංගුවට පත්වූ පසු ඔහු මරා නොදැමිය යුතු බවත්, ඔහුට මානුෂිකව සැලකිය යුතු බවත්, ඈත අතීතයේ පවා හමුදා ප්‍රධානීන් දැන සිටියහ. ඒ පිළිබඳව තම සෙබළුන් දැනුවත් කලහ. මේ අයුරින් ක්‍රමානුකූලව සංග්‍රාමයේ නිරතවූවන්ගේ අත්දැකීම් තුළින් පෝෂණය ලැබූ සංග්‍රාම නීතිය කාලානුරූපව විකාශනය වෙමින් වර්තමානයේදී ජාත්‍යන්තර වශයෙන් යම් රටකට, රාජ්‍යයකට සෘජුවම බලපෑමක් කළහැකි නීතියක් බවට පත්වී ඇත.

## කුරුක්ෂේත්‍ර යුද්ධය

මෙයින් වසර පන්දහකට පමණ පෙර භාරතයේ මෙම සංග්‍රාමය ඇතිවිය. සංග්‍රාමයට එළැඹි ප්‍රධාන පාර්ශ්වයන් වූයේ එකම රජ පවුලකින් පැවත එන ඉතා සමීපතම ඥාතීන් වූ කෞරව හා පාණ්ඩව වංශිකයෝය. ඔවුන්ගේ පරම්පරාගත රාජධානිය වූ හස්තිනාපුරයෙහි සමස්ත පාලනය ගෙන ගියේ ප්‍රබල කෞරව වංශිකයෝය. ඔවුන් කිසිවිටකත් එකම මාලිගාවේ විසූ පාණ්ඩවයන් රාජ්‍ය පාලනයට සම්බන්ධ කර නොගත්හ. අතිදක්ෂ රණශූරයන් වූ පාණ්ඩව කුමාරවරුන් හයදෙනා මෙම අසාධාරණය ඉවසා බැරිම තැන සිය මවත් සමඟින් හස්තිනාපුරයෙන් පැනගොස් විටෙක මහ වනයේද විටෙක වෙනත් හිතවත් රාජධානිවලද උදව් උපකාර ලබාගනිමින් කෞරවයන්ගේ කුරිරු පාලනයට එරෙහිව යුද්ධ සංවිධානය කළේය. තම අයිතිවාසිකම් උදෙසා සටන් වැදීමට සැරසුන පාණ්ඩව කුමාරවරුන් හයදෙනාගෙන් අතිදක්ෂ රණශූරයා වූයේ අර්ජුනය. මෙම පාණ්ඩව කුමාරවරුන්ගේ සියලු කාරණාවලදී උපදෙස් ලබාදුන් මාර්ගෝපදේශකයා වූයේත් අර්ජුන කුමරයාගේ සමීපතම මිතුරා වූ වෘර්ද්‍ධා වනයේ සිට පැමිණි දිව්‍යමය බලයක් සහිත හැඩකාර තරුණයෙකු වූ ශ්‍රී ක්‍රිෂ්ණය.

සාමය සඳහා වූ සියලු සාකච්ඡා සම්මන්ත්‍රණ සහ ගනුදෙනු සිදුකළේ ශ්‍රී ක්‍රිෂ්ණ හරහාය. ඒ මන්ද, පාණ්ඩව පිලේ සිටියද ශ්‍රී ක්‍රිෂ්ණ හට කෞරවයෝද දැක්වූයේ දැඩි ගෞරවයකි. සාමය සඳහා වූ සියලු බලාපොරොත්තු බිඳ වැටුනු පසු කෞරව සහ පාණ්ඩව සේනාවෝ යුද්ධය පිණිස ඔවුන්ගේ පාරම්පරික යුද්ධ භූමිය වූ කුරුක්ෂේත්‍රය නම් විශාල බිම් ප්‍රදේශයට පැමිණ දෙපසින් කඳවුරු බැඳගත්හ. දැන් යුද්ධය ආරම්භ වන දිනය ඉතාමත් ළඟය.

## සම්මත කරගත් සංග්‍රාම නීති

සංග්‍රාමය ආරම්භවීමට නියමිතව ඇත්තේ හෙට දිනයේය. අදදින සන්ධ්‍යා භාගයේ දෙපාර්ශ්වයේම ප්‍රධාන පෙළේ යුද නායකයෝ එක් සාකච්ඡා ශාලාවකට රැස්විය. එක් අතකින් ඔවුන් සියලුදෙනාම සමීපතම ඥාතීන් විය. කුරුක්ෂේත්‍ර පිලේ භීෂ්ම, දෝනාචාර්ය, ක්‍රිපාචාර්ය, දුර්යෝධන ඇතුළු යුද නායකයෝ සහභාගී වූ අතර, පාණ්ඩව පිලෙන් අර්ජුන, භීම, නකුල, අතුල කුමාරවරුන් හයදෙනා එම කුමාරවරුන්ගේ දේවිය වූ දොපදී දේවියගේ පියරජුත් ඔවුන්ගේ මිත්‍රයා වූ ක්‍රිෂ්ණාත් සහභාගී වූහ.

ඔවුන් රැස්වූයේ හෙට දිනයේ ආරම්භ

කිරීමට නියමිත මහා සංග්‍රාමයේදී අනුගමනය කළයුතු යුද නීතිරීති හා සම්ප්‍රදායන් සාකච්ඡා කොට තීරණයකට එළඹීම සඳහායි. සාකච්ඡාවේ මූලාසනය දෙපාර්ශ්වයේම ගෞරවය දිනාසිටි භීෂ්ම නම් කෞරව පිල නියෝජනය කළ වයස්ගත ජ්‍යේෂ්ඨතම සෙන්පතියාට හිමිවිය. දෙපිරිසේම එකඟතාවය මත උල්ලංඝනය නොකිරීමට පොරොන්දු වී සම්මත කරගත් සංග්‍රාම නීති කිහිපයක් මෙසේය.

- මෙම යුද්ධය ඇතිවන්නේ මනුෂ්‍යයන් දෙපිරිසක් අතරේය. එහෙයින් දෙවියන්ට, යක්ෂයන්ට, රාක්ෂයන්ට හෝ වෙනත් එවැනි බලවේගවලට යුද්ධයට සම්බන්ධවීම තහනම්ය.
- එක් පිලක් සම්පූර්ණයෙන්ම පරාජයට පත්වී අනෙක් පිල ජයග්‍රහණය කරන තුරුම යුද්ධය පැවතිය යුතුය.
- උදෑසන හිරු නගිද්දී හක් පිඹීමෙන් (සංඛ) යුද්ධය ආරම්භ වන අතර, ඉර බැස සූර්යයා මැකියාමේදී නැවත හක් පිඹීමෙන් එදිනට යුද්ධය නිමාවිය යුතුය.
- යුද්ධය අවසන් වූ පසුව එදින රාත්‍රියේ යුධ පිටියේදී එක් පසෙක කඳවුරු බැඳ සිටින යම් සෙබළෙකුට අනෙක් පසට ගොස් තම මිතුරන් හෝ ඥාතීන් මුණගැසීමට කිසිදු බාධාවක් නැත්තේය. රාත්‍රිකාලයේදී තම හිතවතුන් මුණගැසීම සඳහා එක් පිලකින් අනෙක් පිලට පැන එන යුද භටයින්ට කිසිදු කරදරයක් නොකළ යුත්තේය.
- තුවාල ලබා හෝ අත්අඩංගුවට පත්වන සෙබළුන් හට කිසිදු හිරිහැරයක් නොකළ යුතුය.
- යුද්ධයට සම්බන්ධ නොමැති පාර්ශ්වයන්ට පහරදීම නොකළ යුතුය.
- කාන්තාවන්ට යුද්ධ භූමිය තහනම් පෙදෙසකි. වෙස්වලාගෙන පැමිණ යුධ වැදුනහොත් කාන්තාවක් බව හඳුනාගත් විගස පහරදීම නතර කළ යුතුය.
- යුද නායකයින් හැමවිටම සටන් වැදිය යුත්තේ යුද නායකයින් සමග පමණි. සතුරු පිලෙහි සෙබළුන්ට වුවද අනෙක් පිලෙහි යුද නායකයින්ට පහරදීම තහනම් වේ.
- පිරිසක් විසින් එක් සෙබළෙකු වට කරගෙන ම්ලේච්ඡ ආකාරයේ ඝාතනය නොකළ යුතුය.

## සංග්‍රාම නීති රැකීම හා උල්ලංඝනය

යුද්ධය දින හතක් තිස්සේ පැවතුනි. මෙහිදී පාණ්ඩව පිලේ ශ්‍රී ක්‍රිෂ්ණ අවි ආයුධ නොදරන බවටත් නිරීක්ෂකයෙකු වශයෙන් පමණක් කටයුතු කරන බවටත් පොරොන්දු වූයේ මෙහි පළවෙනි කොන්දේසිය රැකීම පිණිසය. එහෙත් ලොක ඉතිහාසයේ දරුණුතම ලේ වැගිරීමක් වූ මේ මහා සංග්‍රාමයේදී යුද නීති රැකීම මෙන්ම කැඩීමද සිදුවූ අවස්ථා බොහෝය. එක් අවස්ථාවකදී පාණ්ඩව පිල වෙනුවෙන් රාක්ෂයෙකු යුද පිටියට පැමිණියේය. කෞරවයන්ට එදින යුද්ධය ඉතා අවාසිදායක විය. එදින සන්ධ්‍යාවේදීම මෙම යුද නීති කැඩීම පිළිබඳව කෞරවයෝ ප්‍රශ්ණ කර සිටියෝය. මෙහිදී පාණ්ඩවයෝ කියා සිටියේ ඔවුන් හස්ථිනාපුරයෙන් පලා ගොස් කැළයේ වාසය කළ අවධියේදී රාක්ෂණියකගේ ඉල්ලීම මත භීම නම් වූ පාණ්ඩව කුමාරයා සිය මවගෙන්ද අනුමැතිය ලබාගෙන රාක්ෂණියක් සමග පවුල් ජීවිතය ගත කළ බවයි. එහිදී ඔහුට දාව උපන් පුත්‍රයා තම රාක්ෂයා හෙයින් මෙම ඥාතීත්වය අනුව පාණ්ඩව පිල වෙනුවෙන් යුද වැදීමට ඔහුට අවස්ථාව දිය යුතු බවයි.

තවත් එක් අවස්ථාවකදී කෞරවයෝ වටකරගෙන පහරදී අර්ජුන්ගේ පුත්‍රයා මරා දැම්මේය. තවත් එක් අවස්ථාවකදී පාණ්ඩව පිලේ භීම කුමාරයා ඔවුන්ගේ දේවිය වූ දෞපදී දේවිය මීට පෙර කොණ්ඩෙන් අල්ලා ඇදගෙන ගිය වරදට එය සිදුකළ තැනැත්තාගේ උදරය පලා ලේ දෝතට ගෙන යුද භූමියෙන් පිටතට දිව ගොස් එහි ලැඟුම් ගෙන සිටි දෞපදී දේවියගේ හිස සේදීය. යුද්ධය අවසන් දිනයේ කෞරව පිලේ අස්වමන්නා නම් වූ සෙනවියා යුද බිමෙන් පිටත සිටි කුඩා දරුවන් රැසක්ද මරා දැම්මේය. එකම පරම්පරාවක සමීපතම ඥාතීන්ද ගුරුවරුන්ද ගෝලයෝද දෙපසට වී සටන් වැදුන මෙම මහා සංග්‍රාමයේ හත්වන දිනය වන විට සියලු කෞරවයෝ මිය ගොස් තිබුණි. කුඩා කළ පටන් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනගත් ගුරුවරුන් හා ගෝලයින් අතර පැවති සටන් ඉතාමත් හැඟීම්බර විය. අවසානයේ

> "යුධ භූමියේ සෙබළෙකුගේ කාර්යය වනුයේ තම යුතුකම් හා වගකීම මැනවින් ඉටු කිරීමයි. මෙහිදී මිය යන්නේ කවුද? එහි අවසාන ප්‍රතිඵලය කුමක්දැයි දැනගැනීම සෙබළාට අවශ්‍ය නොවේ. සමහර විට යුද්ධයේ ප්‍රතිඵල ලැබෙන විට සෙබළා ජීවත් නොවන්නට පුළුවන. එසේ වුවත් සෙබළා තම යුතුකම් හා වගකීම මැනවින් ඉටුකළ යුතුය"

ජයග්‍රහණය ලැබූ ධාර්මික පාණ්ඩව කුමාරවරුන් හස්ථිනාපුර රාජධානි යහපත් ආකාරයෙන් පාලනය කළ අතර, ශ්‍රී ක්‍රිෂ්ණ වෘන්දා වනය බලා ගියහ.

## "භගවත් ගීතාව" දේශණා කිරීම

යුද්ධය ආරම්භ කළ පලමු දිනයේ දෙපසෙහිම සේනාවෝ යුධ භූමියේ දෙපසින් පෙළ සදා සිටියේ යුද්ධය ආරම්භ කිරීමට නියමිත සංඥාව ලබාදෙන තෙක්ය. එවෙලෙහිම පාණ්ඩව පිලෙහි අර්ජුන කුමාරයා තම අශ්ව කරත්තයට නැගී දුනු හී රැගෙන සූදානමින් සිටියේය. අශ්ව කරත්තය පැදවූයේ මෙම සංග්‍රාමයේදී අවිආයුධ නොදරන බවට පොරොන්දු වී නිරීක්ෂකයෙකු බවට කටයුතු කරන අර්ජුනගේ මිතුරා වූ ක්‍රිෂ්ණය. මීයට පිම්බාක් මෙන් නිශ්ශබ්දතාවය පැතිරුණ ඒ මොහොතේ අර්ජුන කුමාරයාගේ මනස ව්‍යාකූල විය. මන්ද තමන්ට ඉදිරියෙන් පෙලසදා සිටින සතුරු

පිලේ යුද නායකයින් දෙස බැලීමේදී ඔහුගේ දෙනෙත කඳුලින් තෙමී ගියේය. ඒ කිමෙක්ද යත් සතුර පෙළේ යුද නායකයින් බොහොමයක් තමා කුඩා කාලයේදී එකට කෙලි සෙල්ලම් කළ ඥාති සොහොයුරන් වීමත්, වයස්ගත සෙනවියෝ සියලුදෙනාමත් තමන් පන මෙන් ගෞරව කළ ශිල්ප ශාස්ත්‍ර කියාදුන් ගුරුවරුන් වීමත් නිසා ඔවුන් මරා දමන්නේ කෙසේදැයි අර්ජුනට මහත් ගැටළුවක් විය. ඔහු යුද්ධය අතහැර ආපසු යන බවට තීරණය කළේය. මෙය වටහාගත් ශ්‍රී ක්‍රිෂ්ණා අර්ජුන අස්වැසීය. එහෙත් බෙහෙවින් කලකිරීමට පත්ව සිටි අර්ජුන යථාතත්වයට පත්කිරීම ඉතා අසීරු විය. මෙහිදී ශ්‍රී ක්‍රිෂ්ණ විෂ්ණු දෙවි අවතාරයෙන් පෙනී සිටිමින් සමස්ත ලෝකයටම වැඩදායක "භගවත් ගීතාව" නම් වූ ශ්‍රේෂ්ඨ ධර්මය දේශණා කළේය. එය වර්තමානයේදීද ශ්‍රේෂ්ඨ දහමක් ලෙස ලෝකයේ පවතී. "භගවත් ගීතාව" නිර්මාණය වී ඇත්තේ යුද්ධයත් ලෝකයත් පිළිබඳ අර්ජුන විසින් නගන ලද ප්‍රශ්නවලට ශ්‍රී ක්‍රිෂ්ණ දෙවිඳුන් ලබාදුන් පිළිතුරු වලිනි. එක් උදාහරණයක් වශයෙන් අර්ජුන විසින් නගන ලද ප්‍රශ්ණයකට ශ්‍රී ක්‍රිෂ්ණ විසින් පිළිතුරු ලබාදෙන්නේ මෙසේය.

**අර්ජුන** - මට පවසන්න මිත්‍රය ! යුධ භූමියේ සොල්දාදුවෙකුගේ කාර්යභාරය කුමක්ද?

**ශ්‍රී ක්‍රිෂ්ණා** - යුද භූමියේ සෙබළෙකුගේ කාර්ය වනුයේ තම යුතුකම් හා වගකීම මැනවින් ඉටු කිරීමයි. මෙහිදී මිය යන්නේ කවුද? එහි අවසාන ප්‍රතිඵලය කුමක්දැයි දැන ගැනීම සෙබළාට අවශ්‍ය නොවේ. සමහර විට යුද්ධයේ ප්‍රතිඵල ලැබෙන විට සෙබළා ජීවත් නොවන්නට පුළුවන. එසේ වුවත් සෙබළා තම යුතුකම් හා වගකීම මැනවින් ඉටුකළ යුතුය.

## සංග්‍රාම නීතියේ වර්තමාන පසුබිම

සංග්‍රාම නීතිය යුද්ධ කිරීමේ අවශ්‍යතාවය පිළිගනී. මන්ද යුද්ධයකට එළඹෙන්නේ සාමය සඳහාවූ සියලු ඉඩ ප්‍රස්ථා නැතිවූ විටෙකදීය. එසේ වුවද සංග්‍රාමයේදී පිළිපැදියයුතු ප්‍රමිතීන් කිහිපයක් ඇති බව සෙබළුන්ට හා නිලධාරීන්ට සිහිපත් කිරීම සංග්‍රාම නීතියේ අරමුණයි. මන්ද යුද්ධයේදී එයට සම්බන්ධවන සෙබළුන් හා සාපේක්ෂව බලන කළ එයින් සිවිල් වැසියන්ටද වන හානි ඉමහත්ය. එය එකට දහයක් වැනි භයානක තත්වයක් තරමට වර්ධනය වී ඇත. සංග්‍රාම නීතියේ මෑතකාලීන සංවර්ධනය දෙස බැලීමේදී ජිනීවා සම්මේලනයේදී තීරණය කරගත් නීතිරීති සුවිශේෂ වැදගත්කමක් උසුලයි. එසේම පසුකාලීන "හේග්" සහ " නිව්යෝර්ක්" නීතිද එකසේ වැදගත්වේ. සංග්‍රාම නීතිය සංවර්ධනය වීමේදී දෙවන ලෝක යුද්ධයෙන් පසුව බිහිවූ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතිකළ බලපෑම් සුළුපටු නොවේ. වර්තමානයේදී මෙම අන්තර් ජාතික නීතිරීති අනුගමනය කිරීමට ආරක්‍ෂා කිරීමට සියලු රටවල් අනිවාර්යයෙන්ම බැඳීසිටීමේ තත්වයට පත්ව ඇත. මෙහි සතුටු විය හැකි තත්වයක් වන්නේ මෙම නීති රීති සාදා ඇත්තේ හුදෙක් මනුෂ්‍යයන්ගේ සුගතිය පිණිස වීමයි. මෙම නීති රීති අතර රසායනික අවි භාවිතය තහනම් කිරීම, බිම් බෝම්බ, මර උගුල් වැනිදෑ පිටු දැකීම, පුපුරන හා ගිනි අවුලුවන උණ්ඩ භාවිතය පිටුදැකීම, සාමාන්‍ය ජනයා ආරක්‍ෂා කිරීම, සංස්කෘතික දේපළ ආරක්‍ෂාව, ඉවක් බවක් නොමැති ප්‍රහාර පිටුදැකීම හා යුද සිරකරුවන් ආරක්‍ෂා කිරීම ඉන් සමහරක් වේ.

කර්නල් (විශ්‍රාමික) එම්පීපී පෙරේරා



# පහසුකම් සලසමින්...

53 වන පාබල සේනාංකය යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙබළුන් වෙනුවෙන් නවතමයෙන් ඉදිවූ නේවාසිකාගාර ගොඩනැගිලි 02 ක් එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් ඉකුත් ජූලි 10 වන දින විවෘත කරන ලදී. එහි නිලධාරීන් වෙනුවෙන් වූ කාමර 08 කින්ද, බලලත් නිලධාරී/සැරයන්වරුන් වෙනුවෙන් වෙන්වූ කාමර 18 කින්ද යුක්තය.







# ආපදා අවස්ථාවේදී උපකාරයක්...

පසුගියදා පැවති අධික වර්ෂාව හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල කිනිගම නිවසක් මතට පස් කන්දක් කඩාවැටිණ. එහිදී 11 වන සේනාංක මූලස්ථානයේ සහ 112 වන පාබල බලසේනාවේ භටපිරිස් වහා ක්‍රියාත්මකව එම නිවසෙහි තිබූ දේපළ හා වටිනා දේ සොයා ගැනීමට සහාය වූහ. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) උපදෙස් මත එම මෙහෙයුම දියත්කරන ලදී.

# අවැසි මොහොතේ පිහිටක්...



රත්නපුර ප්‍රදේශයට පසුගියදා ඇදහැලුණු අධික වර්ෂාව හේතුවෙන් ගොඩිගමුව, බුලත්සිංහල මෝල්කාව, ගාල්ල නෙළුව, කුකුලේගඟ පරගොඩ සහ අංගම්මන යන ප්‍රදේශයන්හි ජල ගැලීම් තත්වයක් ඇතිවිය. එහිදී ආරක්ෂක සේනා (බටහිර) ආඥාපතිගේ උපදෙස් සහ මගපෙන්වීම මත 8 වන ගැමුණු හේවා බලඇණිය, ශ්‍රී ලංකා පුරෝගාමී බලකාය සහ 14 වන ගැමුණු හේවා බලඇණියේ භටපිරිස් ක්ෂණිකව ක්‍රියාත්මක වී ආපදාවට ලක්වූ ප්‍රදේශයන්හි සිටි ජනතාව වෙත අවශ්‍ය සහන සැලසීම සඳහා කටයුතු කරනු ලැබූහ. 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ 611 වන පාබල බලසේනාධිපති ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුත්ත සිදුවූහ.

# කුකුල් පැටවුන් පරිත්‍යාගයක්...



කිරාන්, සිත්තන්ඩි, උන්නච්චිය සහ වෙල්ලාවලි ප්‍රදේශයන්හි අඩු ආදායම්ලාභී පවුල් 33 ක් වෙත එක් පවුලක් සඳහා කුකුල් පැටවුන් 20 දෙනා බැගින් කුකුල් පැටවුන් 660 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 26 වන දින සිදුකෙරිණ. 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීඑම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ එම බලප්‍රදේශවල ස්ථාපිත ඒකක අණදෙන නිලධාරීවරුන්ගේ සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් මෙම කටයුත්ත සිදුවිය.



# අවසන් ඉල්ලීම...

මගේ මතකයේ හැටියට ඒ 2009 වසරේ මැයි මස පළමු සතියයි. මේ වනවිට එල්ටීටීඊ ය හා කෙරුණු අවසන් සටනේ අවසන් සහ තීරණාත්මක අදියරට අපි එළඹ සිටියෙමු. නන්දිකඩාල් කලපුව, වෙල්ලමුල්ලිවයික්කාල් හා ඒ ආශ්‍රිත වර්ග කිලෝමීටර් දෙකක පමණ භූමියකට අප ආරක්ෂක හමුදාවන් විසින් ත්‍රස්තවාදීන් ඒ වනවිට කොටුකර ගෙන තිබුණි. එම භූමියේ මේ වනවිටත් එල්ටීටීඊ ග්‍රහණයේ සිවිල් වැසියන් රැසක් සිටි අතර, ත්‍රස්තවාදීන් විසින් ඔවුන් මිනිස් පලිහක් ලෙස යොදා ගනිමින් තිබූ නිසා අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිත ආරක්ෂාව තරකළ යුතු හෙයින් අපට සම්ප්‍රදායික සටන් ක්‍රමවලින් බැහැරව දැඩි අවදානමක් දරාගනිමින් ඉදිරි යුධ කටයුතු මෙහෙය වීමට සිදුව තිබුණි.

එවකට ලුතිනන් කර්නල් වරයෙකු වූ මම අණදෙමින් සිටියේ වන්නි මානුෂීය සටන වෙනුවෙන්ම නගා සිටුවන ලද 17 වන ගැමුණු හේවා බළඇණියටයි. මම එහි ප්‍රථම අණදෙන නිලධාරියා වීමි. අලුතින් නගා සිටුවන ලද බළඇණියක් නිසාම අනිත් බලඇණිවලට සාපේක්ෂව මගේ බළඇණියේ නියමිත නිල සංයුතිය, උපකරණ ආදිය යම් යම් අඩුපාඩු තිබුනද අන් පැරණි බළඇණි හා සමානවම මගේ බළඇණියත් යුදබිමේ පෙරමුණගත තිබුණි. විශේෂයෙන්ම මේ වනවිටත් යුධෝපාය වශයෙන් ඉතා වැදගත් වූ පරන්තන් මංසන්දියද 2009.01.01 වන දින අලුයම අත්පත් කර ගත්තේද 58 වන සේනාංකය යටතේ සිටි මගේ බළඇණිය නිසාවෙන් මගේ සෙබළුන්ගේ සහ නිලධාරීන්ගේ චිත්ත ධෛර්ය තිබුනේද ඉහළ මට්ටමකය. මේ වනවිට ක්‍රියාත්විතයේ යෙදී සිටි සියලු නිලධාරීන්ගේ සහ සෙබළුන්ගේ ඒකායන අධිෂ්ඨානය වී තිබුනේ ඉදිරි පරම්පරාවට යුද්ධය ඉතිරි නොකිරීමයි.

මේ වනවිට අනෙකුත් බළඇණි සමග මගේ බළඇණිය ගමන් කරමින් සිටියේ අවසන් සතුරු බලකොටුව වූ වෙල්ලමුල්ලිවයික්කාල් ගම දෙසටයි. එල්ටීටීඊය විසින් විශාල පස් බැම්මක් නන්දිකඩාල් කලපුවට යාවන සේ ගමට ඇතුල්වන භූමිය ආවරණය කරමින් තනා තිබූ අතර, අප ගමන්ගත් භූමියේ ආවරණද ඉතා අඩුව තිබූ හෙයින් ත්‍රස්තවාදීන්ගේ ස්නයිපර් හා අනෙකුත් බර අවි ප්‍රහාරයන්ට මගේ බළඇණිය ඉලක්ක වී තිබුනි. අවසන් සතුරු බලකොටුව වෙත ඇතුලුවීමට නම් මේ පස් බැම්ම ආක්‍රමණය කළ යුතු වූ අතර, මුලින්ම පස් බැම්මේ පාලනය අත්පත් කරගැනීම අනිවාර්යය විය. ත්‍රස්තවාදීන් සමග ඔවුන්ගේ ග්‍රහණය යටතේ සිවිල් වැසියන් රැසක්ද සිටි හෙයින් අපිට ගුවන් හමුදා සහ කාලතුවක්කු සහය ලබා ගැනීමට නොහැකිවීමෙන් තත්වය වඩාත් දරුණුවී තිබුනි. කිසිදු සිවිල් වැසියකු හට හානිවිය නොහැකි බවට ඉහලින් නියෝග ලැබී තිබුනෙන් අණදෙන නිලධාරීන් වූ අප වෙත තිබූ වගකීමද සුළුපටු නොවීය. මේ අනුව පස්බැම්ම අක්‍රමණය කිරීම සිදුකළ යුතු වුයේ සාම්ප්‍රදායික යුධ උපක්‍රමවලින් බැහැරව ඉතා පරිස්සමිනි.

සාපේක්ෂව ආවරණ අඩු විවෘත භූමියක් මැදින් පස්බැම්ම වෙත ලඟාවීම ඉතා අවදානම් වූ අතර, අප ගමන්ගත් භූමියද ත්‍රස්ථවාදීන් විසින් විවිධ මර උගුල් සහ බිම් බෝම්බ අතුරා තිබුණි. තවද පස්බැම්ම ආවරණයට ගෙන ත්‍රස්ථවාදීන් එල්ලකරන ලද ප්‍රහාර හමුවේ මාගේ හට පිරිස් ඉදිරියට ඇදීම සිදුකළේ දැඩි අවදානමකින් යුතුවය. මේ සියලු දුෂ්කරතා මැදින් පස්බැම්මට මීටර් 150 ක් පමණ ලඟාවීමට මගේ බළඇණිය සමත් විය. පස්බැම්මට ඉදිරියෙන් ත්‍රස්ථවාදීන් විසින් මීටර් 03 ක් පමණ පළලින් යුතු දිය අගලක්ද තනා තිබූ බැවින් දිවා කාලයේදී බැම්ම ආක්‍රමණය කිරීම අවදානම් විය.

මේ අනුව රාත්‍රී කාලයේදී ප්‍රහාරයක් එල්ලකොට පස් බැම්ම අත්පත්කර ගැනීමට සැලසුම් සකස් විය. ඒ අනුව පසුදා අළුයම 03 ට පමණ ක්ෂණික ප්‍රහාරයක් එල්ලකොට පස්බැම්ම සහ අවට භූමියේ කොටසක් මුලින්ම අල්ලා ගැනීම සැලසුම විය.

නවතමයෙන් නගා සිටුවන ලද බළඇණියක් බැවින් මගේ බළඇණියේ ප්‍රමාණවත් තරම් නිලධාරීන් නොසිටි අතර, ඇතැම් බණ්ඩයන්ට (Platoon) අණදුන්නේ සැරයන්වරුන් විසිනි. පසුදා ප්‍රහාරය එල්ල කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට එදින සන්ධ්‍යාවේ සියලුම මගේ නිලධාරීන්, සැරයන්වරුන් සහ පෙළභාර කෝප්‍රල්වරුන් පසෙක වූ ආරක්ෂක ස්ථානයකට කැඳවූ මම ඔවුන් සමග ඉදිරි සැලසුම් සකස් කළෙමි. සැලසුම වූයේ මුලින්ම එක හට කණ්ඩායමක් පස්බැම්ම තරණය කර ඉන් කොටසක් අල්ලාගැනීම සහ ඉන්පසු ඉතිරි හටපිරිස් ඒ හරහා ගොස් අවට භූමියේ බලය තහවුරු කර ගැනීමයි. බැම්ම ඉදිරියෙන් වූ දිය අගල තරණය කිරීමට මෙන්ම පස් කණ්ඩියට ගොඩවීම සඳහා කඩිනමින් තාවකාලික ලී පාලම් හා ඉනිමං සෑදූ අතර, මෙය ඉතා අවදානම් දුෂ්කර කාර්යයක් බවද අප තේරුම් ගෙන තිබුණි.

ප්‍රහාරය සැලසුම් කිරීමෙන් පසු භූමියේදී සැකසූ උණුසුම් තේ කෝප්පයකින් අප සප්පායම් වෙමින් සිටින අතරතුර, බැම්මට මුලින්ම ගොඩවීමට නම් කරන ලද "සී කණ්ඩායමට" අයත් බණ්ඩයක බණ්ඩභාර නිලධාරියෙකු ලෙස සිටි සැරයන් පුෂ්ප කුමාර සෙමින් මා වෙත පැමිණ මදක් පැකිලීමෙන් යුතුව මට පවසා සිටියේ ඔහුට මා සමග සිකරට්ටුවක් පානය කිරීමට අවැසි බවයි. හමුදා විනය අනුව සෙබළුන් විසින් නිලධාරීන් අභිමුව දුම් පානය නොකරන අතර මගේ ප්‍රතිචාරය පිළිබඳ පුදුමයෙන් මෙන් අන් නිලධාරීන් හා සෙබළුන් බලා සිටියදී දෙවරක් නොසිතාම මම සැරයන් පුෂ්ප කුමාරට දුම්වැටියක් දී මමද දුම්වැටියක් දල්වා ගතිමි. ඔහු කිසියම් අවිනිශ්චිත බවකින් සිටින්නේදැයි මම විමසූ විට සැහැල්ලුවෙන් මෙන් දුම් වළල්ලක් පා කරමින් ඔහු මට ස්ථිර හඩින් පවසා සිටියේ "සර්, මම පස්බැම්ම කොහොම හරි කඩනවා සර්" කියාය. ඉතා නිර්භීත සහ කාර්ය ශූර සෙබළෙකු වූ ඔහුගේ පිටට තට්ටුවක් දැමූ මම ඔහුට සුබ පැතුවෙමි.

සැලසුම් කළ පරිදි පසුදා අළුයම 0300 ට පමණ අපි ප්‍රහාරය දියත් කළ අතර, දැඩි ත්‍රස්ත ප්‍රතිප්‍රහාර මධ්‍යයේ ඉතා දුෂ්කර වූත් තීරණාත්මක වූත් සටනකින් පසු පසුබැම්මේ මීටර් 150 ක් පමණ කොටසක් අල්ලාගැනීමට මගේ සෙබළුන්ට හැකි විය. මඳ වේලාවකට පසු "සී කණ්ඩායම" භාර කපිතාන් වරයා මට ගුවන් විදුලි පණිවිඩ නුවමාරුව හරහා දන්වා සිටියේ ත්‍රස්තවාදීන් විසින් එල්ලකරන ලද ක්ලේමෝර් බෝම්බ ප්‍රහාරයකට සැරයන් පුෂ්ප කුමාර ලක් වූ බවත් ඔහුගේ තත්වය බරපතල බවත්ය. ප්‍රහාරයේ ඉදිරි කටයුතු සාර්ථකව සිදුකළද සැරයන් පුෂ්පකුමාර ඇතුළු මාගේ සෙබළුන් කිහිපදෙනෙක් සටනේදී ජීවිත පුදදී තිබුනි.

2009 මැයි මස 19 වන දින ආරක්ෂක හමුදාවන්ට යුද්ධය සාර්ථකව නිම කිරීමට හැකි වූ අතර යුද්ධයෙන් පසු මම එන ප්‍රථම නිවාඩුවේදී මම එන අතරමග පිහිටි සැරයන් පුෂ්ප කුමාරගේ නිවසට ගොඩවීමට මට හදිස්සියේ සිත්විය. නිවසට ගොඩවූ මම මියගිය සෙබළාගේ අණදෙන නිලධාරියා බව නිවැසියන්ට සැලකර සිටියෙමි. තවමත් සිය ස්වාමියාගේ හදිසි වියෝවෙන් ලද කම්පනය හේතුවෙන් වික්ෂිප්තව සිටි සැරයන් පුෂ්ප කුමාරගේ බිරිඳ සිය කුඩා දියණිය තුරුලුකරගෙනම හැඩූ කඳුලින් මා පිළිගත්තා ලදී. බහ තෝරන වයසේ සිටි කුඩා බිලිඳිය සහ කම්පාවෙන් සිටින මේ තරුණ කාන්තාවගේ දොම්නස් සහගත මුහුණ දකින්ම ඉතා අසාමාන්‍ය ලෙස මා සමග දුම්වැටියක් ඉරීමට සිතක් පහළ වීම ඔහුගේ අවසන් ඉල්ලීම විය හැකි බවට නිසි අයුරු තේරුම් නොගැනීම සබැඳිව මට මා පිළිබඳවම නොපහන් හැඟීමක් ඇතිවූ අතර කිරිකැටි දසන් දක්වා මට සිනාසෙන කුඩා බිලිඳිය දෙස බොඳවූ දෑසින් සහ බරවූ හදවතින් යුතුව මම අරමුණකින් තොරව බලා සිටියෙමි.



**මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටච්චි**
අධ්‍යක්ෂ ජෙනරාල් - මානව හිමිකම් සහ මානුෂවාදී නීති සහ අධ්‍යක්ෂ
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්.
යුද්ධ හමුදා මූලස්ථානය

# සංවත්සර දිනයේ මතක සටහන්...



යුද්ධ හමුදාවේ පැරණිතම බලකායක් වන 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකාය සිය අභිමානවත් 62 වන සංවත්සරය පසුගිය ජූලි 05 වන දින සෞඛ්‍ය නීතිරීතිවලට අනුගත වෙමින් හා ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් චාම් අයුරින් සමරනු ලැබීය. මහා සංඝරත්නය විෂයෙහි දානමය පුණ්‍ය කර්මයක් සිදුකිරීම, බලකා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීම, සියලු නිල භෝජන සංග්‍රහයක් පැවැත්වීම හා කොරෝනා අවදානම් හේතුවෙන් අසරණව සිටින පවුල්වලට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය අඩංගු පාර්සල් බෙදාදීම ආදී කටයුතු රැසක් එහිදී සිදුකරනු ලැබීය.

# යාපනයේ එන්නත්කරණයට හමුදාවේ සහාය...




ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති ගේ අධීක්‍ෂණය යටතේ යාපනය ජනතාව වෙත සයිනොෆාම් එන්නතේ දෙවන මාත්‍රාව ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 03 වන දින යාපනය දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සිදුකරන ලදී. යාපනය, චන්කනෙයි, චාවකච්චේරිය, කරවෙඩ්ඩි, කෝපායි, නල්ලූර්, පේදුරුතුඩුව, සන්දිලිප්පායි, තෙලිප්පලෙයි හා මරුතන්කේනි එන්නත් කිරීමේ මධ්‍යස්ථානවලදී 4 වන යුද්ධ හමුදා වෛද්‍ය බලකාය විසින් අදාළ ප්‍රදේශවල වෛද්‍ය නිලධාරීන්ගේ සහ මහජන සෞඛ්‍ය පරීක්‍ෂකවරුන්ගේ සහයෝගය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබූහ.



කොවිඩ් 19 වෛරසය ආසාදිත වූ අයවලුන් හට ප්‍රතිකාර කරනු ලබන දැඩිසත්කාර ඒකක සඳහා අවශ්‍ය උපකරණ හා යන්ත්‍ර දිවයිනේ රෝහල් 12 ක් වෙත පරිත්‍යාග කිරීමට ඇමෙරිකානු ශ්‍රී ලංකා සංසදය විසින් ක්‍රියාකරන ලදී. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් සහ මගපෙන්වීම මත එම පරිත්‍යාග කඹුරුපිටිය ආදපාන ප්‍රාදේශීය රෝහල් අධ්‍යක්‍ෂක වෙත නිල වශයෙන් භාරදීම ඉකුත් ජූනි 29 වන දින සිදුකෙරුණේ 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ මූලිකත්වයෙනි.



ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයට අයත් වව්නියාව දිස්ත්‍රික්කයේ සිවිල් ජනතාව හට එන්නත්කරණ වැඩසටහනක් යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් හා සෞඛ්‍ය අංශවල සහය ඇතිව ව/ගාමිණී මහා විද්‍යාලයේදී ඉකුත් ජූලි 07 වන දින පැවැත්විණ.

මෙහිදී වව්නියාව නගරය, වව්නියාව නගරය (උතුර), රඹකුලම හා වෛරපුලියම්කුලම් යන ග්‍රාම නිලධාරී වසම්වල වයස අවුරුදු 60 ට වැඩි සිවිල් වැසියන් 1000 කට එන්නත්කරණය සිදුකරන ලදී.



# අවැසි මොහොතේ උපකාරයක්...



4 වන ගැමුණු හේවා බලඇණිය ස්ථාපිත බලප්‍රදේශයට අයත් එරාවූර් පුන්නකුඩා ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් 22 ක් හා මඩකලපුව දිස්ත්‍රික්කයේ බෞද්ධ විහාරස්ථාන 12 ක් වෙත රුපියල් 3500.00 ක් පමණ වටිනාකමකින් යුත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 02 වන දින පවත්වන ලදී. 231 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් විඑම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ සිදුකළ එම කටයුත්ත සඳහා 23 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධානත්වය දැරීය.

# හමුදා දැනුම වර්ධනයට රුකුලක්...




59 වන පාබල සේනාංක මූලස්ථානය යටතේ ඇති 19 වන ගැමුණු හේවා බලඇණිය සහ 12 ශ්‍රී ලංකා පාබල හමුදාවෙහි රාජකාරී නියුතු කනිෂ්ඨ නිලධාරීන්ගේ හමුදා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් *Map Marking, Voice Procedure and Practicing of Decision Making Processs* යන මාතෘකා යටතේ වැඩසටහනක් ඉකුත් ජූලි 12 සහ 14 යන දිනයන්හි පවත්වන ලදී.

# බෝග වගාවට තවත් පියවරක්...



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් සීකේ හඳුන්මුල්ල ගේ උපදෙස්වලට අනුව ශ්‍රී ලංකා කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රාහක දායකත්වයෙන් ඉකුත් ජූලි 04 වන දින 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා අනුබණ්ඩය ස්ථාපිත කුට්ටිගල කඳවුරෙහි අක්කර 05 ක පමණ භූමි ප්‍රමාණයක කහ බීජ වගාකිරීමේ නව ව්‍යාපෘතියක් අරඹන ලදී. එම කඳවුරෙහි නිලධාරී අණදෙන කපිතාන් එච්ජීජේසී කුමාර ගේ අධීක්ෂණය යටතේ පැවති මෙම වැඩසටහන 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.



යුධ හමුදා ක්‍රීඩක කෝප්‍රල් රණතුංග කරුණානන්ද



## දැවැන්ත පරාජයක් තුළ අති විශිෂ්ට ජයග්‍රහණයක් හිමිකර ගත්

# යුධ හමුදා කෝප්‍රල්වරයා

දැවැන්ත පරාජයක් තුළ අති විශිෂ්ට ජයග්‍රහණයන් සැඟව ඇති බව පසක් කරවමින් ඔලිම්පික් ඉතිහාසය පුරාම සිය නාමය රන් අකුරින් සනිටුහන් කළ විශිෂ්ටතම ශ්‍රී ලාංකීය ක්‍රීඩකයෙකු පිළිබඳ මතකය අවදි වනුයේ උදාවූ ඔලිම්පික් උළෙල සමයේදීමය. එම විශිෂ්ට ක්‍රීඩකයා අන් කවරෙකුවත් නොව, වර්ෂ 1964 ජපානයේ පැවති ඔලිම්පික් තරඟාවලියේ දී මීටර් 10.000 දුර දිවීමේ තරඟාවලියෙන් ලංකාව නියෝජනය කිරීමට ඉදිරිපත් වූ යුධ හමුදා ක්‍රීඩක කෝප්‍රල් රණතුංග කරුණානන්දයි.

ඒ අනුව වර්ෂ 1964 දී පැවති එම ඔලිම්පික් තරඟාවලියට ලංකාව නියෝජනය කිරීමට ගිය යුධ හමුදා කෝප්‍රල් රණතුංග කරුණානන්ද ට තරඟ කිරීමට සිදුවූයේ ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, ටියුනීසියාව ආදී ලොව ප්‍රමුඛ පෙළේ රටවලින් පැමිණි ජාත්‍යන්තර මට්ටමේ මලල ක්‍රීඩකයන් රැසක් සමඟින්ය.

කෙසේ වුවත් තරඟය ආරම්භ කිරීම වෙනුවෙන් ආරම්භක වෙඩිල්ල තබන පිස්තෝලකරුගේ අවිය ක්‍රියාත්මක වූ සැනින්, කරට කර සූදානමින් එක පොකුරට සිටි, තරඟකරුවන් සියල්ලම එකිනෙකා පරයමින් වේගයෙන් දිව යද්දී, මඳක් අසනීප තත්වයෙන් පෙළෙමින් සිටියද දී වුව, ඒ ගැන කිසිදු තැකීමක් නොකළ කෝප්‍රල් කරුණානන්ද තම හැකි උපරිමයෙන් එම ධාවන පථය තුළ දිව ගියත් වට දහයක් පමණ අවසන් වද්දී තරඟාවලියට සහභාගී වූ සියලුම ක්‍රීඩකයන්ගේ අන්තිමයා බවට පත් වූයේය. එමෙන්ම තමාට වඩා ශරීර දේහ ප්‍රමාණයෙන් විශාල, ලොව බලවත් රටවල් රැසක මලල ක්‍රීඩකයන් පසු පස තරඟය ආරම්භ කළ වේගයෙන්ම තව දුරටත් දිව යමින් එම තරඟයේ ඉතිරි වට කිහිපය සම්පූර්ණ කිරීමට ඔහු සමත් විය.

එමෙන්ම, එම තරඟාවලියේ 20 වන වටය ආරම්භයත් සමඟින් ලොව සුපතල දුර ධාවකයකු වන ඇමරිකාවේ බිලී මිල්ස් විනාඩි 28 යි තත්පර 17.6 කින් එම තරඟය නිමා කරමින් තරඟාවලියේ රන් පදක්කම් ලාභියා බවට පත් වුණා. එමෙන්ම තරඟයේ දෙවන හා තෙවන ස්ථාන වෙනුවෙන් ද ඒ වන විටත් ජයග්‍රාහකයන් තේරී පත් වී තිබුනත්, ලංකාව නියෝජනය කරමින් තරඟ වැදී සිටි කෝප්‍රල් කරුණානන්ද පමණක් තවදුරටත් තරඟ බිම තුළ රැඳී සිටිමින් එම තරඟාවලිය නිමා කිරීම සඳහා ඔහුට අවසන් කිරීමට නියමිතව තිබූ ඉදිරිවට හතරක්ම සම්පූර්ණ කිරීමට අධිෂ්ඨාන



යුධ හමුදා ක්‍රීඩක කෝප්‍රල් රණතුංග කරුණානන්ද වර්ෂ 1964 ජපානයේ පැවති ඔලිම්පික් තරඟාවලියේ දී මීටර් 10,000 දුර දිවීමේ තරඟාවලියට සහභාගි වූ අවස්ථාව.

කරගෙන තිබුණා. ඒ අනුව ඔහු තමා තරගය ආරම්භ කරන අවස්ථාවේ ලබාගත් වේගය ඒ අයුරින්ම පවත්වා ගනිමින් ඉදිරි වට කීපය සම්පූර්ණ කිරීම සඳහා නොපසුබස්නා අධිෂ්ඨානයෙන් යුතුව දිව ගියා. එමෙන්ම ඔහු දෙස මුළු ප්‍රේක්ෂකාගාරයම මහත් කුතුහලයෙන් බලා සිටියේ ඒ වන වන විටත් එම තරඟාවලිය වෙනුවෙන් සහභාගී වෙමින් තිබූ අනෙකුත් ක්‍රීඩකයන් රැසක් තරගය අතහැර දමා ධාවන පථයෙන් ඉවත්ව තිබූ නිසයි. එමෙන්ම කෝප්‍රල් කරුණානන්ද පමණක් තවදුරටත් එම තරග බිම තුළ නොපැකිළව දිව යද්දී ප්‍රේක්ෂකාගාරය තුළ සිටි ඇතැම් ප්‍රේක්ෂකයන්ගේ උසුළු විසුළු වලට පවා ලක්වීමට පළමු වටය තුළදී ඔහුට සිදු වුවා. කෙසේ වුවත් ඔහු පළමු වටය අවසන් කර දෙවන වටයට පිවිසෙන විට එතෙක් ඔහුට උසුළු විසුළු කරමින් සිටි මුළු ප්‍රේක්ෂකාගාරය ම නිහඬ වී තිබුණා. එමෙන්ම අතරින් පතර පොඩි අත් අත්පොළසන් නාදයක්ද පැතිර ගිය අතර එම තරගය නිමා කිරීම වෙනුවෙන් අවසන් කළ යුතු තුන්වන වටය නිමා කරද්දී, තරගය නැරඹීමට පැමිණ සිටි මුළු ප්‍රේක්ෂකාගාරයම ඔහු වෙනුවෙන් ඔල්වරසන් දෙමින් ජයඝෝෂා නගනුයේ සියල්ලන්ම මවිතයට පත් කරවමිනි. එමෙන්ම තරගයේ අවසන් වටය ඔහු නිමා කරනුයේ "කමෝන් සිලෝන්" "කමෝන් සිලෝන්" යනුවෙන් මුළු ප්‍රේක්ෂාගාරයම නැගී සිට ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත් වී ඔහුට ඔල්වරසන් දෙමින් ජයඝෝෂා නගද්දියි. තරඟාවලිය නිමා කළ කෝප්‍රල් කරුණානන්ද යළි ප්‍රේක්ෂකාගාරය වෙත පිවිසෙද්දී ඔහු වෙත දිව ආ එම තරඟාවලියේ ජයග්‍රාහක ඇමරිකාවේ බිලි මිල්ස් කෝප්‍රල් කරුණාරත්නට සුබ පතමින් පවසනුයේ තරගය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රන් පදක්කමේ සැබෑ හිමිකරුවා වනුයේ කෝප්‍රල් රණතුංග කරුණානන්ද බවය.

කෙසේ වුවත් මේ සිද්ධියත් සමගින් දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් ජපානයට පවා විශාල ආදර්ශයක් ගෙන දීමට කෝප්‍රල් රණතුංග කරුණාරත්න සමත් වෙනවා. ඔහු එම තරගාවලිය පුරා දැක්වූ විශිෂ්ට සහභාගිත්වය මෙන්ම ඔහු තුළ තිබූ නොපසුබට අධිෂ්ඨානය හා උත්සාහය පිළිබඳව ඉතා ප්‍රසාදයට පත් ජපන් බලධාරීන් එරට පාසල් පෙළ පොත් වලට පවා කෝප්‍රල් කරුණානන්ද ගේ කතාව ඇතුළත් කොට තිබුනේ ශ්‍රී ලංකාවට ද ඉමහත් කීර්තියක් අත්පත් කර දෙමිනුයි.




ලුතිනන් දුමින්ද සෙනරත්
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය




# "සුභ සාධක පහසුකම් සහ විනය පවත්වා ගැනීමේ වැදගත්කම"





යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි යුද්ධ හමුදා විනය පවත්වා ගැනීම, නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති සුභසාධන වැඩපිළිවෙලවල් සහ ඔවුන් හට එම සුභසාධන ක්‍රමවේදයන් යටතේ ලබාගත හැකි ප්‍රතිලාභ සම්බන්ධයෙන් වඩාත් විධිමත් අයුරින් අවබෝධයක් ලබාදීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 03, 04 සහ 05 යන දිනවල ආරක්ෂක සේනා මූලස්ථාන (මුලතිව්) සහ (වන්නි) හිදී පැවැත්විණ. මෙම දේශන යුද්ධ හමුදා විධායක ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියු සහ විනයාරක්ෂාධිපති බ්‍රිගේඩියර් ඒඑල් ඉලංගකෝන් ඇතුළු නිලධාරීන් විසින් මෙහෙයවනු ලැබූහ.

එහිදී ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම ආරක්ෂක සේනා මූලස්ථානයේ සහ 21 වන පාබල සේනාංකයේ පැවති වැඩසටහන් සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් 130 කට ආසන්න පිරිසක් සහභාගි වූහ. තවද ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජී පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථානයේදී පැවති වැඩසටහන සඳහා නිලධාරීන් සහ සෙසුනිලයින් 130 කට ආසන්න පිරිසක් සහභාගි වූහ.





# ඒකක සංචාරයක්...





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති හා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඉකුත් ජුලි 11 වන දින 561 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශයේ රාජකාරි සිදුකරනු ලබන හටපිරිස් ආමන්ත්‍රණය කළේය. එම අවස්ථාව සඳහා 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඩීඑන්එස්පී දූනුවිල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 561 වන පාබල බලසේනා මූලස්ථායේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ආර්එම්පීඑස්බී රත්නායක ඇතුළු නිලධාරීන් ද රැසක් සහභාගි වූහ.

# දෙමළ භාෂා පාඨමාලාවේ ආරම්භක දේශනයට එක්වෙමින්...

ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ ඇති 59 වන පාබල සේනාංකය වෙතින් පාලනය වන ඒකකයන්හි රාජකාරියේ නියුතු සෙනින්ගේ දෙමළ භාෂා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් වූ පාඨමාලාවක් ඉකුත් ජුලි 07 වන දින එම පාබල සේනාංක මූලස්ථානයේදී පවත්වන ලදී.

59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබණ්ඩාර යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඇරඹි එහි ආරම්භක දේශනයට බලසේනාධිපතිවරු, එම සේනාංක නිලධාරීන්, සෙසුනිලයින්, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ. මෙය එහි ඇරඹි අංක - 45 වන දෙමළ භාෂා පාඨමාලාව වේ.





# සංචාරයක මතක සටහන්...



65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්ටීබී දිසානායක ආර්එස්පී යූඑස්පී ඉකුත් ජූලි 11 වන දින එම පාබල සේනාංකයට අයත් බලසේනා මූලස්ථානයන්හි සංචාරයක නිරත විය. එහිදී, 651 සහ 652 වන පාබල බලසේනා මූලස්ථාන ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය. හමුදා සම්ප්‍රදායන්ට මූලිකත්වය දෙමින් එහිදී 10 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ සහ 19 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් විසින් සේනාංකාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් ද පිළිගන්වනු ලැබීය.

---






# බලඇණි ආධාරක අවි ජේ්‍යාකොනොනි පාඨමාලාව අංක 91

පාබල පුහුණු මධ්‍යස්ථානය වෙතින් ආරම්භ කරනු ලැබූ බලඇණි ආධාරක අවි ජේ්‍යාකොනොනි පාඨමාලාව සිසුන් 58 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජූලි 09 වන දින සිට සැප්තැම්බර් 14 වන දින දක්වා පැවැත්වේ. එහි ආරම්භක දේශනය පාබල පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් පීඑස්කේ සංජීව ආර්ඩබලිවපී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එහි පුහුණු පාසල් ශ්‍රවනාගාරයේදී සිදුකෙරිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පවත්වනු ලබන පාඨමාලා අතුරින් මෙම පාඨමාලාව සුවිශේෂී වන බව හා මෙම බලඇණි ආධාරක අවි පාඨමාලාව හදාරා ඉන් ඉහළ සාමාර්ථයක් ලබාගැනීම තුළින් විදේශ රාජ්‍යන්හි පවත්වනු ලබන බලඇණි ආධාරක අවි පාඨමාලාවන් සඳහා සහභාගීවීමේ අවස්ථාව හිමිවන බවද සේනාවිධායක විසින් එහිදී පාඨමාලා සිසුන් වෙත සිහිපත් කරන ලදී.

# සිහිනයක් සැබෑවෙයි...



යාපනය දිස්ත්‍රික්කයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතියේ තවත් පියවරක් ලෙස මරුදන්කේනි, වැම්පියන්පත්තු (දකුණ) ග්‍රාම නිලධාරී වසමේ පදිංචි තුෂිකාන්දන් අන්ජනාතේවි යන අය වෙත නව නිවසක් පරිත්‍යාග කිරීම ඉකුත් ජූලි 10 වන දින ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# විරු දැතින් හිසට සෙවණක්...



14 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු බලප්‍රදේශයට අයත් මයිල්වාහනම්පුරම් ගම්මානයේ දිළිඳු පවුලක් වෙත එම ඒකකය වෙතින් නව නිවසක් ඉදිකරදෙන ලදි. එම නිවස ඉකුත් ජූලි 13 වන දින ආරක්ෂක සේනා (කිලිනොච්චි) ආඥාපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ සුරතින් අදාළ පවුල වෙත භාරදෙන ලදි.







# අලුත්වැඩියා කළ වාහන හා උපකරණ යුද්ධ හමුදාවේ පරිහරණයට...

ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශයේ ක්‍රියාත්මක සහ පාලන රාජකාරී සඳහා යොදවනු ලැබ විවිධ ආබාධයන්ට ලක්ව අක්‍රිය වී අලුත්වැඩියා කටයුතු සඳහා ගාල් කර තිබූ වාහන, විදුලි ජනක යන්ත්‍ර, ජල පොම්ප ආදිය කෙටි කාලයක් තුළදී අළුත්වැඩියා කිරීමට 4 වන විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය කටයුතු කරන ලදී.

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් මත එසේ අලුත්වැඩියා කරන ලද එම යන්ත්‍ර සූත්‍ර හා වාහන අදාළ ඒකක වෙත මුදාහැරීම ඉකුත් ජූලි 18 වන දින ආරක්ෂක සේනා (යාපනය) ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණි. එම අවස්ථාවට 51, 52 හා 55 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# අභිනවයෙන් ඉදිකිරීම් රැසක්...





4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රාජකාරියේ නියුතු සෙබළුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක්ව තිබූ සෙසුනිල භෝජනාගාරය කෙටි කාලයක් තුළ අභිනවයෙන් ඉදිකර පසුගිය මැයි 24 වන දින ඒකක අණදෙන නිලධාරී මේජර් එස්එම්පී බංඩාර ගේ සුරතින් විවෘත කෙරිණ. එමෙන්ම ඒකකයට එතෙක් අඩුපාඩුවක්ව පැවති වෙඩි ද්‍රව්‍ය ගබඩාව, සම්මාන පීඨිකාව, ධජ ඔසවන ස්ථානය සහ ඉදිරිපස වැට ද එලෙස නවතමයෙන් ඉදිකර විවෘත කරන ලදී.

# දිළිඳු පවුල් වෙත පරිත්‍යාගයක්...

65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීඑම්ටී දිසානායක ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් සහ මගපෙන්වීම මත 653 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඑච්එස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ එම බලප්‍රදේශයේ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අසරණ වී සිටින අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් දියත් කෙරිණ. ඉකුත් ජූනි 23 වන දින කිරිසුඩ්ඩාන් පාසලේදී පැවති මෙම ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනට ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ප්‍රධානත්වය දැරීය. 24 වන ගජබා රෙජිමේන්තුව විසින් සංවිධානය කළ මෙම කටයුත්තට *Second Coffee International* යන සමාගම මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී.



---

# විරුවන්ගෙන් සරණක්...



231 වන පාබල බලසේනාව යටතේ පාලනය වන පාවක්කොඩිචේනෙයි සහ රාජතුරෙයි යන ප්‍රදේශයන්හි ආර්ථික අපහසුතාවයන්ට ලක්වූ තෝරාගත් අඩුආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක මළු 100 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 10 වන දින පැවැත්විණ. 4 වන ගැමුණු හේවා බලඇණියේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජීආර්ආර්ටල් ජයසිංහ ආර්එස්පී සහ එම ඒකක හටපිරිස්හි සහයෝගයෙන් අදාළ වැඩසටහන සිදුකෙරිණ.

---

# ජන දිවියට සත්කාරයක්...

511, 513 සහ 515 වන පාබල බලසේනාවන්හි හටපිරිස් විසින් ඉකුත් ජූනි 24 වන දිනට යෙදුණු පොසොන් පුර පසළොස්වක පොහොය දිනය නිමිති කොටගෙන චුන්නාකම්, උඩුවිල්, ඉනුවිල්, කරෙයිනගර්, චුල්ලිපුරම්, වන්කාලෙන, සිලලයි සහ තායිඅඩි ප්‍රදේශයන්හි ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා දිවා ආහාර පාර්සල් සහ වියළි සලාක මළු පරිත්‍යාග කිරීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් සිදුකරන ලදී.



> අලම්පිල්, මුල්ලියාවේලි, පුදුකුඩිඉරිප්පු සහ වෙල්ලමුල්ලිවයික්කාල් යන ප්‍රදේශ වටකොට ගනිමින් නැගෙනහිර මුහුදු සීමාවේ උපක්‍රමික වැදගත්කමක් ඇති සියලු ප්‍රදේශයන්ට මහගු ශක්තියක් වෙමින් රාජ්කාරී ඉටුකළ මුලතිව් යුද්ධ හමුදා කඳවුර මුලතිව් නගරය කේන්ද්‍ර කොට ගනිමින් පිහිටුවා තිබුණි. එවකට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 25 වන බලසේනාව ලෙස ක්‍රියාත්මක වූ මෙම කඳවුර හුදකලා භූමි භාගයක පිහිටා තිබුණු නමුදු මිනීමරු එල්ටීටීඊ ත්‍රස්තවාදයට එරෙහිව ශක්තිමත්ව සේනා සංවිධානව සිටින ලදී. 9 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ 6 වන විජයබාහු පාබල රෙජිමේන්තුව යන ප්‍රධාන බළඇණි දෙකකින් තවත් ආධාරක හා සේවා බළකා කිහිපයකින්ද පොලිස් හා නාවික අනුඛණ්ඩ දෙකකින්ද සැදුනු භටපිරිස් මෙහි අවසන් වරට සේවයේ යෙදී සිටියහ. කඳවුර පිහිටා තිබූ හුදෙකලා පිහිටීම තම විශාලතම අවිය කරගත් මිලේච්ඡ ත්‍රස්තවාදීන් 1996 ජූලි 18 දින අලුයම පටන් එම කඳවුරට අඛණ්ඩව ප්‍රහාර එල්ලකරන ලද අතර, එහිදී අපගේ එඩිතර රණකාමීන් අවසන් මොහොත තෙක්ම සටන් වැද මව්බිමේ ස්වෛරීත්වය උදෙසා සිය ජිවිත පුදකළහ. එම සටනින් මියගිය අය අතර, යුද්ධ හමුදා නිලධාරීන් 44 ක් සහ සෙබළුන් 1125 ක් විය. ඔවුනගේ එම ජීවිත පරිත්‍යාගයට වටිනාකමක් ලබාදෙමින් මුලතිව් ප්‍රහාරයෙන් වසර 13 කට පසු මුළුමහත් ලක් දෙරණ ත්‍රස්තවාදීන්ගෙන් අතුගා දැමීමට එඩිතර වීර හමුදාව සමත්විය.

# මුලතිව් ප්‍රහාරයේ 25 වසර සැමරේ

(1996.07.18 - 2021.07.18)







මුලතිව් ඛේදවාචකයේදී දිවිදුන් වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කිරීම පිණිස මුලතිව්හි ඉදිකොට ඇති රණවිරු ස්මාරකය අභියසදී එම ඛේදාන්තයට වසර 25 ක් සපිරීම නිමිත්තෙන් පුෂ්පෝපහාර දැක්වීමේ උත්සවයක් ඉකුත් ජූලි 18 වන දින පැවැත්විණි.

එම අවස්ථාවට ප්‍රධාන අමුත්තන් ලෙස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති හා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති හා ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජී පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී වූහ. තවද 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේආර්කේකේටී බංඩාර ආර්එස්පී යූඑස්පී, 591 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 9 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හා 6 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරීවරු ඇතුළු නිලධාරීන් සහ සෙබළුන් රැසක් ද ඊට එක්වූහ.

## උපාධිය...

නිද්වරා තුන් තිස් පැය පුරා
ඇල් වතුර වීදුරුවෙන්
කහට කෝප්පයකින්
ජීවිතය ගැට ගසා...

අකුරින් අකුර මුමුණා
වචනයෙන් වචනය ගලපා...
සිප්සතරෙ පරතෙරට ගිය මා
සරසවිය තුළින් තැනූ මාලිගාවට
පා තබන්න නොහැකිව
ලබාගත් උපාධිය ශාපයක්...

සෙ/2ඩී03197
**ලා/කෝ දයාරත්න ඩීඩීවී**
2 ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ක්‍රීඩා සංවර්ධන ගම්මානය
පනාගොඩ

## අලුත් පෙන්ෂුයින්...

උඩුවියන් වෙනුවෙන් සිවිලිම
පයට පාවඩ වෙනුවට
විල්ලුද පලස් අතුරා
ජ්‍යොතිෂයට අනුව
සැදූ මාලිගාවල
සතුරෙකුට වත් ආ නොහැකිසේ
වටකර ඇති තාප්පයට
ශක්තියක් සේ
ඉදිකර ඇති විසල්
ගේට්ටුව අභිමුවේ

හිමිදිරි උදෑසන එල්ලා ඇති
පෙන්ෂුයින් ක්‍රමයක් දෝ
කියා සිතෙන
සතිගණන් පල්වෙන කසල මළු

**මේජර් කේකේවීඑස් කුමාර**
ශ්‍රීලංජාආබමු

## රණවිරුවා...

ජීවිතය ආදරය
අෑත සිට අත වනයි
මෑණියන් පෙම්වතිය
දුරට වී පෙම් බඳියි
පතිනියද පුංචි පුතු
දුරට වී ඉකි බිඳියි
වීර පුතු යෞවනය කැපකරන්
යුද බිමක අවි දරයි...

සෙ/753797
**කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම්**
ඉසේරෙ

## සිත...

නෙතු අගින් දුක මකා
මුවග සිනා තැවරෑ තරම්
අතරමං වූ සිතට මගෙ
සෙනෙහෙ ගෙන හැඩකළ තරම්
අතරමං වේදෝ යළිත්
විමසනවා මගේ සිත
මටම වදයක් වෙලා මගේ සිත

සෙ/6අර්00496
**කෝප්‍රල් ඒකනායක ඊඑම්ආර්සී**
ජ්‍යෙආසමිකා - යුහමු




## දවසක සතුටක් තියේවි...

ඔබ ඔබේ ගමන යද්දී
සමහර මිනිස්සු
ඔබට රවයි
ඔබට හිනාවෙයි
ඔබව රිදවයි
ඒ වගේම
සමහරු ඔබව විවේචනය කරයි
ඒ මිනිසුන්ගේ ස්වභාවය
ඒත් ඔබ ඔබේ ගමන යන්න
අසාධාරණයට හිස නොනමන
සාධාරණයට හිස නමන
බොරුව නොමැති
අවංක මිනිසෙකු ලෙස
දවසක සතුටක් තියේවි ඔබට
ඔබ කොතැනක කොහොම
කෙසේ හෝ සිටියත්...

සෙ/කිහු104364
**ලා/කෝ බංඩාර කේඑම්ඒඑච්**
9 ශ්‍රීලංජාආබමු

## විදු මාතාව රකිම්...

කිරි පුසුඹ පිස ළමා මුවේ
ඔබා කට කට අයනු ආයනු
පොවා ගුණ දම් පොත සෙනෙහසින්
පොහොසත් කළා සතර සිප්දම්
සෙනෙහසින්...

විලස දැනුමේ ආලෝකය
මගේ වසන්තය හෙළි කෙරෑ
සසර පුරා නුඹ කළ ගුණය
ගයමි කවි කොට සෙනෙහසින්

නුඹය විදු මෑණියනි
ගුරු මෑණියනි ගුරු පියාණනී
ඔබ සෙනෙහස ලබා ලද සිප්සතර
ආසිරි කළ යුතුය දිවි තුරා

නිති බැතියෙන් සිහිපත් කරමි
ගතින් නුඹ සැම දවසේ
දයාබර විදු මව්ණී
රකිමි ඔබ නිති බැතියෙන් සැමදා

සෙ/240640
**ඔනි 1 වයිඑම්ඊජීඑන් කුලසේකර බංඩා**
මව්ගෙ අම - යුහමු

## මට දැනෙන සතුට...

ගමන නුඹේ හෙමින්මයි
එදා සිට අදටත්...
තියා පියවර සිතා බලලා
තබයි නිසි තැන එදා සිට අදටත්...
කාට කාටත් දැනෙන විදියට
නුඹේ හැකියා පෙනුණෙ නැත කාටවත්...
රටක් ජයගෙන ලොවක් දිනන්නට
ගියේ නුඹ හෙමි හෙමින්මයි...
පෙරට යන්නට උදව් දෙන්නට
සිටිය අය අතලොස්සක්ම අද
පතයි නුඹ හට ජයම ගන්නට...
ඉගෙනුමෙන් ඉදිරියට යන්නට
නුඹට දිරිය දෙන්නට මම
කළ නොකළ දෙයක් නම් නැත
මටම දැනෙනා තරමට
දිනන හැම විටකම නුඹ
මට දැනෙන සතුට නිම්හිම් නැත
යෝධබල යෝධ ශක්තිය ගෙන
ඉදිරි ගමනට සැරසෙන්න නුඹ
ලක්මවට කීර්තිය ගෙන එන්න
නුඹට වෙර වීරියක් ඇත එමට
ෂඩ් භාෂා පරමේෂ්වරයෙන්
පිදුම් ලබන්නට හැකිය නුඹ හට
සිතේ ශක්තිය අරන් දිවිමගට
යන්න බුදු ගුණින් සිහිකරන් හැමවිට

**ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති - ජාශිබ**
මව්ගෙ අම - යුහමු



# එන්නත්කරණයට සංඥා බලකායේ දායකත්වය...

සෞඛ්‍යාරක්ෂිත උපදෙස් හා නීතිරීතීන්ට අනුව ක්‍රියාකරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කොවිඩ්-19 උවදුර මැඩලීම සඳහා ලබාදෙනුයේ අසීමිත දායකත්වයකි. එහිදී ඉහත කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා තාක්‍ෂණික හා මානව සම්පත් ලබාදෙමින් ශ්‍රී ලංකා සංඥා බලකාය ඉටුකරනුයේ පුරෝගාමී මෙහෙවරකි. ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් පීජ්පේ පීරිස් එන්ඩීයු ගේ මගපෙන්වීමෙන් හා අධ්‍යක්‍ෂ තොරතුරු තාක්‍ෂණ බ්‍රිගේඩියර් කේසී ප්‍රතාපසිංහ ගේ සෘජු අධීක්‍ෂණය යටතේ සිදුකරන එම එන්නත්කරණ වැඩසටහන් තුළදී ලබාගන්නා අදාළ ජීවදත්ත තොරතුරු පරිගණක ගත කොට එන්නත්කරණ විස්තර යාවත්කාලීන කිරීම සඳහා 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්ඩී කොතලාවල ආර්එස්පී, එහි තොරතුරු තාක්‍ෂණ නිලධාරීන් සහ සෙසුනිලයින් ද කැපවීමෙන් ඉටුකරනුයේ වගකීම් සහගත කාර්යභාරයකි.

එම සෑම අවස්ථාවකදීම අනෙකුත් හමුදා සෙබළුන් මෙන් සෘජුවම දායකත්වය ලබාදී ඇති සංඥා රෙජිමේන්තුවේ දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් අසීමිත කැපකිරීමක් සිදුකරමින් සෞඛ්‍ය වෛද්‍ය කණ්ඩායම් සමග උරෙන් උර ගැටෙමින් ජීව දත්ත තොරතුරු පරිගණක ගතකිරීම සඳහා තම ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එසේම නවීන තොරතුරු තාක්‍ෂණය උපයෝගී කරගනිමින් e-චැනලින් මාධ්‍යකාංග භාවිතයෙන් කෙටි කාලයක් තුළ විශාල ජන කොට්ඨාශයක් වෙත එන්නත්කරණය සඳහා දායකත්වය ලබාදීමටද හැකිවීම තුළින් ශ්‍රී ලංකා සංඥා බලකායට මෙන්ම පොදුවේ සමස්ත යුද්ධ හමුදාවටද කීර්තියක් අත්කරදීමට හැකිවී ඇත.

# කාබනික පොහොර පිළිබඳ දැනුවත් කිරීමක්...




643 වන පාබල බලසේනාවේ පූර්ණ අධීක්‍ෂණය මත 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු කඳවුරු පරිශ්‍රයේදී කාබනික පොහොර සකස් කිරීම පිළිබඳව ප්‍රදේශයේ සිවිල් අයවළුන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළුවක් පැවැත්විණ. මේ සඳහා මඩ්ඩුපුධාන් කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්‍ෂ කේ. කීර්තිහන් මහතා සහ මුතියන්කඩ්ඩුකුලම් ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශක නිලධාරී ඇතුළු කෘෂිකර්ම අංශයේ නිලධාරීන් රැසක් එක්වූහ.

එම අවස්ථාවට 643 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීටී ද සිල්වා ආර්එස්පී පීඑස්සී සහ 13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ දෙවන අණදෙන නිලධාරී මේජර් කේඑන්සී ද සිල්වා ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් ද සහභාගී වූහ.

# මුල්ගල් තැබීමක්...



21 වන පාබල බලසේනාව යටතේ ඇති 212 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් තන්තිරිමලේ රුවන්ගම පදිංචි රවීන්ද්‍ර රණසිංහ යන අය හට නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීමේ උත්සවය ඉකුත් ජූනි 11 වන දිනට යෙදුණු සුබ මොහොතින් 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. 212 වන පාබල බලසේනාධිපතිගේ ඉල්ලීම පරිදි හෝමාගම වෙසෙන දානපතියෙකු වන රසිත් මනතුංග යන අයගේ මූල්‍ය පරිත්‍යාගයෙන් මෙම නිවස ඉදිකරනු ලබයි.

# දිළිඳු පවුල් වෙත සහනයක්...



ඉකුත් ජූනි 24 වන දිනට යෙදුණු පොසොන් පුර පසළොස්වක පොහොය දිනය නිමිති කොටගෙන 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම සේනාංක බලප්‍රදේශයට අයත් සෙල්වපුරම් හි ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා දිවා ආහාර පාර්සල් 300 ක් පරිත්‍යාග කිරීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් එහි භටපිරිස් විසින් සිදුකරනු ලැබූහ.

# පාඨමාලා ජයලබා...



යුද්ධ හමුදා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන රණවිරු සෙවණ රාගම සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරයෙහි කාර්මික ශිල්පී රාජකාරියේ නියුතු 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට අයත් සෙ/653325 ලා/කෝප්‍රල් සමීර ආර්වීඑස්එන් යන කොනොහි 2021 වර්ෂයේ නිමාවට පත්වුණු කාම්බෝජයේ *Cambodian School of Prosthetics and Orthotics in Phnom penh, Cambodia* ආයතනය මගින් පවත්වනු ලැබූ සෘජුකාරක හා අංගාදේශක කාර්මික ශිල්පී *(CAT I I I)* එක් අවුරුදු පාඨමාලාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී එම පාඨමාලාව ඉතා සාර්ථකව අවසන් කරන ලදී.

ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත සිවිල් පුරවැසියන් සඳහාද කෘත්‍රිම අවයව සහ ශල්‍ය උපකරණ නිෂ්පාදනයෙහිලා පුරෝගාමී මෙහෙවරක් සිදුකරනු ලබන රණවිරු සෙවන - රාගම සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරයෙහි මෙවන් ඉතා දක්ෂ හා කාර්යශූර රණවිරුවන් බිහිවීම එම ආයතනයේ අභිවෘද්ධියට ඉමහත් පිටුවහලකි.

## චන්ද්‍රපාල...

**මම** - චන්ද්‍රපාල... මගෙ සාක්කුවෙ තිබුණ රුපියල් පනහ නෑ... මේ ගෙදර ඉන්නේ අපි දෙන්න විතරනෙ...



**චන්ද්‍රපාල** - ඔව් සර්... ඒ නිසා අපි දෙන්න රුපියල් විසිපහ විසිපහ දාල නැති වෙච්ච පනහ අමතක කරල දාමු...

## දක්ෂකම...



**විනිසුරු** - මේ අපරාධය බොහොම තියුණුව හා සියුම්ව සැලසුම්කර කරපු අපරාධයක්... මේක දක්ෂකමයි තියුණු නුවණකුයි නැතුව කරන්න බැහැ...

**විත්තිකරු** - අනේ හාමුදුරුවනේ... තමුන්නාන්සෙ කොච්චර බටර් ගෑවත් මම නම් ඒ ගැන මොනවත් කියන්නෙ නැහැ...

## ලිලියන්...

**දොස්තර මහතා (දුරකථනයෙන්)** - ලිලියන්... ඊයේ හවස මා ළඟට ආපු එක කොච්චර හොඳද?

**ලිලියන්** - ඇයි ඩොක්ටර්...? ඊයෙ අනේ සනේ නැතුවද හිටියෙ...?



## බහින්බස් ගාස්තු...

**බිරිඳ** - මම හොයාගත්ත මගේ මහත්තයගෙන් සල්ලි ඉල්ලගන්න ක්‍රමයක්...

**මිතුරිය** - ඒ කොහොමද...?

**බිරිඳ** - අපි දෙන්න ඊයෙ බහින්බස්වීමක් උණා... මම කිව්ව මම එළිවුණ හැටියෙ අම්ම ළඟට යනවයි කියල... එයා මට බස් ගාස්තුව එවලෙම දුන්න...



## අකුරු දැනීම...

**මහාචාර්යතුමා** - අප කරන ලද සමීක්ෂණයකට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට අනූනවයකටම අකුරු කියවන්න දන්නෙ නැහැ...

**ශිෂ්‍යයාව** - ඒක වෙන්න බැහැ සර්...

**මහාචාර්යතුමා** - ඇයි වෙන්ඩ බැරි...? කොළඹ අවට රවුමක් ගිහින් බලන්න... මෙහි කුණු කසල දැමීම තහනම් කියල ලියල තියෙන තැන්වල කොච්චර ලොකු කුණු ගොඩවල්ද තියෙන්නෙ කියල...

## පිළියම...

**මහාචාර්යතුමා** - සිරිසේනට කියන්න පුළුවන්ද රැකී රක්ෂා හිඟය නැති කරන්න පිළියමක්...

**සිරිසේන** - ඔව් දූපත් දෙකක් හොයාගෙන එකකට පිරිමි විතරක් දානවා... අනිකට ගැහැණු විතරක් දානවා...

**මහාචාර්යතුමා** - එතකොට...?

**සිරිසේන** - දෙගොල්ලොම බෝට්ටු හදන්න පටන් ගනීවි...



# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Be Used to

යම් කිසි ක්‍රියාවක් හෝ යම් දෙයක් කිරීම සබැඳිව හොඳින් "අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව" ප්‍රකාශ කෙරෙන වාක්‍යය රටාවක් වශයෙන් මෙම වාක්‍යය රටාව හඳුන්වා දිය හැක.

***Fomular*** :- සූත්‍රය

**Subject + Be used to + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + බී යූස්ඩ් ටු + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්
කර්තෘ + අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව + ක්‍රියාපදය + (***ing*** ස්වරූපය) + කර්මය + ඉතිරිය

***Ex*** / උදා :-

1. He is used to playing cricket.
   හී ඊස් යූස්ඩ් ටු ප්ලේයින්ග් ක්‍රිකට්.
   ඔහුට ක්‍රිකට් ක්‍රීඩා කරන එක හොඳින් හුරු දෙයක්.

2. She is used to dancing at the parties.
   ෂී ඊස් යූස්ඩ් ටු ඩාන්සින්ග් ඇට් ද පාටීස්.
   ඇයට පාටිවල නටන එක හොඳින් හුරු දෙයක්.

3. I am used to reading  books.
   අයි ඇම් යූස්ඩ් ටු රීඩින්ග් බුක්ස්.
   මම පොත් කියවන්න පුරුදුවෙලා ඉන්නේ.

4. He is used to telling lies.
   හී ඊස් යූස්ඩ් ටු ටෙලිං ලයිස්.
   ඔහු බොරු කියන්න පුරුදුවෙලා ඉන්නේ.

***Nota Bene*** / සැ.යු :-

මෙම වාක්‍යය රටා භාවිතා කාරීමේදී පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

- **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමග ව්‍යාකරණානුකූලව භාවිතා වේ.

- **Be used to:-** "අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව" ආදි වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම වාක්‍යය ඛණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයට භාවිතා කළ හැක.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී **(ing)** ස්වරූපයේ ක්‍රියා පදයක් ලෙස භාවිතා කළ යුතුය.

- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන හා බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා කළ හැක.

- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදි වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අවසානයට භාවිතා කළ හැක.

**Analysis of the sentence formation -** වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය

**Subject + Be used to + Verb (ing) + Object + Rest.**
සබ්ජෙක්ට් + බී යූස්ඩ් ටු + වර්බ් (අයිඑන්ජී) + ඔබ්ජෙක්ට් + රෙස්ට්
කර්තෘ + අත්දැකීම් ඇති බව, පළපුරුද්ද ඇති බව + ක්‍රියාපදය + (***ing*** ස්වරූපය) + කර්මය + ඉතිරිය

He is used to playing cricket.
හී ඊස් යූස්ඩ් ටු ප්ලේයින්ග් ක්‍රිකට්.
ඔහුට ක්‍රිකට් ක්‍රීඩා කරන එක හොඳින් හුරු දෙයක්.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රටාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මග හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.


කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk




**වෘත්තීය දිවියේ අනේකවිද කඩඉම් පසුකොට**
**සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට**
**දිරිය, විරිය, රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.**



අධ්‍යක්ෂ ජෙනරාල්
පාබල හමුදා ශාඛාවේ
අධ්‍යක්ෂ ජෙනරාල් පාබල ලෙස
**මේජර් ජෙනරාල්**
**ඊඒඩීජේ බංඩාර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩියු**
**2021 ජූලි මස 30 දින සිට**



ආරක්ෂක සේනා (මධ්‍යම)
ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියු**
**2021 ජූලි මස 09 දින සිට**



ආරක්ෂක සේනා (යාපනය)
ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියු**
**2021 ජූලි මස 19 දින සිට**



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඒපීඅයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී**
**යූඑස්පී**
**2021 ජූලි මස 21 දින සිට**



ආරක්ෂක සේනා (බටහිර)
ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඩීපීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියු**
**2021 ජූලි මස 08 දින සිට**



උපකරණ මාස්ටර් ජෙනරාල්
ශාඛාවේ උපකරණ මාස්ටර්
ජෙනරාල් ලෙස
**මේජර් ජෙනරාල්**
**එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියු**
**2021 ජූලි මස 19 දින සිට**



කමාන්ඩෝ රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී**
**පීඑස්සී**
**2021 ජූනි මස 29 දින සිට**



54 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස්**
**පීඑස්සී**
**2021 ජූලි මස 28 වන දින සිට**



55 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එම්කේ ජයවර්ධන ආර්එස්පී**
**යූඑස්පී එන්ඩියු**
**2021 ජූනි මස 23 දින සිට**



22 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඩබ්ලිව්ඩබ්ලිව්එම්ආර්එස්පී**
**අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 ජූලි මස 19 දින සිට**



පාබල පුහුණු මධ්‍යස්ථානයේ
සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**සී රණවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**එන්ඩියු**
**2021 ජූලි මස 21 දින සිට**



64 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**යූපීආර් වීරකෝන් ඩබ්ලිව්ඩබ්ලිව්වී**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**2021 ජූලි මස 07 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බ්‍රිගේඩියර් (පාලන/නිවාස) ලෙස
**බ්‍රිගේඩියර් පීකේඅයි විතානච්චි**
**2021 ජූලි මස 08 දින සිට**



සන්නද්ධ බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති ලෙස
**බ්‍රිගේඩියර් පීඑච්එම් පීරිස් ආර්එස්පී පීඑස්සී**
**2021 ජූලි මස 19 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) ලෙස
**බ්‍රිගේඩියර් ජේඑම්එල් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී**
**2021 ජූලි මස 15 වන දින සිට**



652 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස
**කර්නල් ඩබ්ලිව්ඩීයූඑස් වනසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී**
**2021 ජූලි මස 16 දින සිට**



622 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස
**කර්නල් ඒඑම්ඊ අබේසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 මැයි මස 17 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) කර්නල් (ප්‍රමාණි) ලෙස
**කර්නල් ඩීජේආර්එච් සිල්වා ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 ජූලි මස 08 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) කර්නල් (සම්බන්ධීකරණ) ලෙස
**කර්නල් කේපීකේ ආරියදාස ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 මැයි මස 08 දින සිට**



කාලතුවක්කු හමුදා පුහුණු පාසලේ සේනාවිධායක ලෙස
**කර්නල් කේඩීඩීඑච්ආර් කන්නන්ගර ආර්එස්පී අයිජී**
**2021 ජූලි මස 08 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) කර්නල් (සම්බන්ධීකරණ) ලෙස
**කර්නල් ඩීඑස් හොරවලවිතාන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව් ආර්එස්පී**
**2021 ජූනි මස 29 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) කර්නල් සම්බන්ධීකරණ ලෙස
**කර්නල් සිසි වික්‍රමරත්න ආර්එස්පී යූඑස්පී**
**2021 ජූලි මස 10 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ජ්‍යෙෂ්ඨ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස
**කර්නල් එස්එම්එස් සමරකෝන්**
**2021 ජූලි මස 19 දින සිට**



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස
**ධුතිගත් කර්නල් එෆ් ජෝසප් යූඑස්පී**
**2021 මැයි මස 17 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ප්‍රමාණි 1 (ක්‍රියා) ලෙස
**ධුතිගත් කර්නල් පීඑස්කේ රණතුංගගමගේ ආර්එස්පී පීඑස්සී**
**2021 ජූලි මස 05 දින සිට**



ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපළ සේනාවිධායක ලෙස
**ධුතිගත් කර්නල් එච්කේඑල්එස් සිල්වා**
**2021 ජූලි මස 05 දින සිට**



7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර් එම්ජේඑම් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**
**2021 ජූනි මස 04 දින සිට**



12 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස
**මේජර් එම්සීආර් මාකවිට ආර්ඩබ්ලිව්පී පීඑස්සී**
**2021 ජූලි මස 16 දින සිට**

# විවෘත කිරීමක්...



23 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අභිනවයෙන් ඉදිවූ නව නිලධාරී නිවස්නය එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒබීඑස් අතුකෝරල ආර්ඩබ්ලිව්පී ගේ ආරාධනයෙන් ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එස්පීකේජ් පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් ඉකුත් ජූලි 09 වන දින සුබ මොහොතින් විවෘත කරන ලදි.


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බඹි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ

සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ

සෙ/754676 ලාන්ස් කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ගුහ දිගුව

51445/51446

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






අධ්‍යක්ෂණය

මේජර් ජෙනරාල් කේඩීපීජේ කොට්ටවත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලංකාපාහසේ



සහාය සංස්කාරක

කපිතාන් කේඩීඑම් පැරකුම් - ශ්‍රීලංකාකාබ

# යුද්ධ හමුදා රෝහලේදී ගුරුභවතුන්ට එන්නත්කරණය...







අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත යුද්ධ හමුදාව විසින් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන ජාතික එන්නත්කරණ වැඩසටහනට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සම්බන්ධීකරණයෙන් බස්නාහිර පළාතේ ගුරුභවතුන් එන්නත් කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 12 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහලේදී ආරම්භ කරනු ලැබීය.

යුද්ධ හමුදා වෛද්‍ය කණ්ඩායමක් විසින් සිදුකළ අදාළ එන්නත්කරණ වැඩසටහනේදී ගුරුභවතුන් විශාල පිරිසකට එකවර එන්නත්කරණය සිදුකරන ලදී. එම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පසුගියදා ගරු අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජීඑල් පීරිස් ඇතුළු අමාත්‍යවරුන් සමග ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ද එක්වූහ.

තවද, මෙම අවස්ථාවට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල ඇතුළු මැති ඇමතිවරුන්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කේ කපිල පෙරේරා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් ද සහභාගි වූහ.




# අතැර නොයන ලෙංගතුකම්...

පවතින කොරෝනා තත්වය හේතුවෙන් උතුර නැගෙනහිර ප්‍රදේශයන්හි සිටින විශ්‍රාමිකයින්ට සිය විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා බැංකු වෙත යාමේ අපහසුතා පැනනැගුණි. එහිදී සුපුරුදු ලෙසට මෙවරද ඊට මැදිහත්වූ යුද්ධ හමුදාව ඔවුනට අවැසි ප්‍රවාහන පහසුකම් සලසාලමින් අනෙකුත් සෙසු සහායන් ලබාදීමටද නොමසුරුව ක්‍රියාකරන ලද්දේ රණවිරු මෙහෙවර නිබඳවම ජනසෙත හා රැකවරණය පිණිසම බැව් යළි යළිත් පසක් කරමිනි.

